දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය
புகையிலை மற்றும் மதுபானம் மீதான தேசிய அதிகாரச்சபை
National Authority on Tobacco & Alcohol

2022

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
Annual Report

වාර්ෂික වාර්තාව
2022



දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය

01 පටුන

පිටු

01	පටුන	03
02	වගු ලැයිස්තුව	06
03	රූප ලැයිස්තුව	07
04	අපගේ මෙහෙවර හා දැක්ම	09
05	ආයතනික තොරතුරු	10
06	ප්‍රධාන අරමුණු හා කර්තව්‍ය	11
07	සභාපතිතුමාගේ සමාලෝචනය	12
08	අධ්‍යක්ෂවරු	14
09	අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව	17
10	විගණන කමිටුවේ වාර්තාව	18
11	ආයතනික පාලන වාර්තාව	19
12	2022 වසරේ ප්‍රගතිය (2022 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා)	21
12.1.	නෛතික ක්‍රියාමාර්ග	21
12.1.1.	බලයලත් නිලධාරීන් විසින් ගනු ලැබූ නෛතික ක්‍රියාමාර්ග	21
12.1.2.	අධිකාරිය විසින් ගනු ලැබූ නෛතික ක්‍රියාමාර්ග	22
12.2.	දුම්කොළ හා මද්‍යසාර නිවාරණය හා වැලැක්වීම පිළිබඳ සහතිකපත්‍ර මනෝ උපදේශන පාඨමාලාව (දෙවන ශිෂ්‍ය කාණ්ඩය)	23
12.3.	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය සමග සහයෝගිතාවයෙන් දුම්කොළ හා මද්‍යසාර නිවාරණය හා වැලැක්වීම පිළිබඳ සහතිකපත්‍ර මනෝ උපදේශන පාඨමාලාව	24
12.4.	කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සමග සහයෝගිතාවයෙන් දුම්කොළ හා මද්‍යසාර නිවාරණය හා වැලැක්වීම පිළිබඳ සහතිකපත්‍ර මනෝ උපදේශන පාඨමාලාව	24

12.5.	ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් පවත්වනු ලැබූ ශ්‍රී ලංකාව තුළ දුරකථන උපදේශනය පිළිබඳ මාර්ගගත පුහුණු වැඩමුළුව	24
12.6.	දුම්කොළ හා මද්‍යසාර නිවාරණය හා වැලැක්වීම පිළිබ සහතිකපත්‍ර මනෝ උපදේශන පාඨමාලාවේ පුහුණු උපදේශන නිලධාරීන් සඳහා සමාලෝචන රැස්වීම	24
12.7.	1948 උපකාරක දුරකථන සේවාව පිළිබඳ තොරතුරු	25
12.8.	යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ කුඩා ව්‍යවසාය අංශයේ ක්ෂෙත්‍ර නිලධාරීන් සඳහා උද්දේශන වැඩමුළුව	25
12.9.	දු.ම.ජා.අ. පනතට යෝජිත සංශෝධන පිළිබඳ සමාලෝචන රැස්වීම	26
12.10.	ශ්‍රී ලංකාවේ දුම්කොළ වගාව වෙනුවට විකල්ප භෝග හඳුන්වාදීම පිළිබඳ නියමු ව්‍යාපෘතියේ පළමු හා දෙවන ඇගයීම්	28
12.11	මොණරාගල හා අනුරාධපුර දිස්ත්‍රික්කවල දුම්කොළ වගාව වෙනුවට විකල්ප භෝග පිළිබඳව කෘෂිකර්ම නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප ඉහළ නැංවීමේ වැඩමුළුව	29
12.12.	දුම්කොළ හා මද්‍යසාර නිවාරණය පිළිබඳ ජාතික සමුළුව- 2022	30
12.13.	දු.ම.ජා.අධිකාරියේ ආචාර ධර්ම සමාලෝචන කමිටුව ස්ථාපිත කිරීම	33
12.14.	පාසල් පෙළ පොත් සඳහා දුම්කොළ හා මද්‍යසාර නිවාරණය ආශ්‍රිත සෞඛ්‍ය පණිවිඩ සකස් කිරීම	34
12.15.	අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කළ 20/2020 චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීම ඇගයීම	34
12.16.	දුම්කොළ හා මද්‍යසාර නිවාරණය හා වැලැක්වීම පිළිබඳ සහතිකපත්‍ර මනෝ උපදේශන පාඨමාලාව ඩිප්ලෝමා පාඨමාලාවක් දක්වා උත්ශ්‍රේණි කිරීම	34
12.17.	ගෝලීය වැඩිහිටි දුම්කොළ සමීක්ෂණය -2020	34
12.18.	දත්ත සිට ප්‍රතිපත්ති දක්වා මැයෙන් වූ වැඩමුළුව	34
12.19.	දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ප්‍රජා දැනුවත් කිරීමේ වැඩසටහන යාවත්කාලීන කිරීම (එක් එක් දිස්ත්‍රික්කය සඳහා උග්‍ර අභ්‍යන්තර රෝගීන් සඳහා ඒකකය/පුනරුත්ථාපන මධ්‍යස්ථානය/සක්‍රීය මහජන හා යෝග්‍යතා ඒකකය)	35
12.20.	මාධ්‍ය ක්‍රියාකාරකම්	35
12.21.	චිත්‍රපටි සමාලෝචන වාර්තා සාරාංශය	36
12.22.	මාධ්‍ය සම්මාන උත්සවය - 2022	37

12.23.	V NATA ජනමාධ්‍ය මඟින් සිදුකරන උල්ලංඝනය කිරීම් පිළිබඳ ජංගම යෙදුම	38
12.24.	V NATA බලයලත් නිලධාරීන්ගේ ජංගම යෙදුම	39
12.25.	ජාත්‍යන්තර සම්මේලන	39
12.26.	මහජන සෞඛ්‍ය නිලධාරීන් සඳහා නිදහස් කලාප යළි සක්‍රීය කිරීමේ වැඩසටහන	40
12.27.	දුම්කොළ වලින් තොර කලාප ස්ථාපිත කිරීම වෙනුවෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ දායකත්වය ඇගයීම	42
12.28.	බස්නාහිර පළාතේ සෞඛ්‍ය වෘත්තිකයන්ට කරුණු දැක්වීම	42
12.29.	වෛද්‍ය උපාධි අපේක්ෂකයන් සඳහා දුම්කොළ හා මද්‍යසාර නිවාරණය පිළිබඳ විෂයමාලාව සංවර්ධනය	43
12.30.	මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පුවත්පත් කලාවේදීන් සඳහා උද්දේශන වැඩසටහන	44
12.31.	විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සඳහා දුම්කොළ හා මද්‍යසාර නිවාරණ ධාරිතා ගොඩ නැංවීමේ පුහුණුව (ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය)	45
12.32.	විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සඳහා දුම්කොළ හා මද්‍යසාර නිවාරණ ධාරිතා ගොඩ නැංවීමේ පුහුණුව (දේශීය වෛද්‍ය ආයතනය)	46
12.33.	ග්‍රාම නිලධාරීන් සවිබල ගැන්වීම හරහා මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බිම් මට්ටමේ දුම්කොළ හා මද්‍යසාර නිවාරණ ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම	46
12.34.	ජා.දු.ම.අ. පනත ක්‍රියාත්මක කිරීම පිළිබඳව බලයලත් නිලධාරීන් පුහුණු කිරීම	47
12.35.	ජාතික ප්‍රවාහන කොමිෂන් සභාවේ සහයෝගිතාවයෙන් බස් රථ රියදුරන් හා කොන්දොස්තරවරුන් සඳහා වැඩමුළුව	47
12.36.	දුම්කොළ හා මද්‍යසාර නිවාරණය පිළිබඳ වැඩමුළුව - බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	48
13	මූල්‍ය ප්‍රගතිය (2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා)	49
අ.	මූල්‍ය ප්‍රකාශන	50
ආ.	මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	54
ඇ.	විගණකාධිපති වාර්තාව	62

02 වගු ලැයිස්තුව

		පිටු
වගුව 1	දු.ම.ජා. අධිකාරිය පනත යටතේ සුරාබදු නිලධාරීන් විසින් පවරා ඇති නඩු	23
වගුව 2	දු.ම.ජා. අධිකාරිය පනත යටතේ පොලිස් නිලධාරීන් විසින් පවරා ඇති නඩු	23
වගුව 3	1948 වෙත ලැබුණු ඇමතුම් විස්තර	28
වගුව 4	චිත්‍රපට සමාලෝචන පිළිබඳ දළ විශ්ලේෂණය	44
වගුව 5	VNATA යෙදුම සඳහා මුළු ලියාපදිංචි නිලධාරීන් සංඛ්‍යාව	47
වගුව 6	VNATA යෙදුමෙන් ලත් මුළු වාර්තා සංඛ්‍යාව	47
වගුව 7	එක් එක් අංශය සඳහා ලැබුණු විමර්ශන වාර්තා සංඛ්‍යාව	47
වගුව 8	දුම්කොළ වලින් නිදහස් කලාප යළි සක්‍රියකිරීමේ වැඩසටහනේ විස්තර	49

03 ඡායාරූප ලැයිස්තුව


01, 02 , 03	සහතිකපත්‍ර පිරිනැමීමේ උත්සවයේ විශේෂ සිදුවීම්
04 , 05	සහභාගිවූවන් වැඩසටහනේ ක්‍රියාකාරකම්වල නිරතව සිටින අයුරු
06	කොළඹ දිස්ත්‍රික්කයේ පැවැත්වූ වැඩසටහන
07 ,08	කුරුණෑගල දිස්ත්‍රික්කයේ පැවැත්වූ වැඩසටහන
9,10,11,12,13,14,15,16, 17,18	දුම්කොළ සඳහා බදුකරණ සූත්‍රයක් සකස් කිරීම පිළිබඳව වූ අනුකමිටුවේ රැස්වීම්
19 , 20	සම්පත් දායකයන් තම ඉදිරිපත් කිරීම් සිදුකරමින්
21	සහභාගිවූවන් සඳහා සහතිකපත්‍ර ප්‍රදානය
22,23,24,25,26, 27,28 , 29	අපේක්ෂකයින් වාචික ඉදිරිපත් කිරීම් සිදුකරමින්
30, 31, 32 & 33	උත්සවයේ වැදගත් සිදුවීම්
34, 35, 36, 37, 38 , 39	උත්සවයේ වැදගත් සිදුවීම්
40	කුරුණෑගල දී මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා පැවැත්වූ වැඩසටහන
41,42 , 43	මාතර පැවැත්වූ වැඩසටහන
44, 45, 46 , 47	ම"සෞ"පරීක්ෂකවරුන්ට සහතිකපත්‍ර පිරිනැමීම
48, 49 , 50	සෞඛ්‍ය වෘත්තිකයන් සඳහා වැඩසටහන
51 , 52	උත්සවයේ වැදගත් සිදුවීම්
53, 54 , 55	විශ්වවිද්‍යාල සිසුන් සඳහා වැඩසටහන
56, 57 , 58	විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සඳහා දුම්කොළ හා මද්‍යසාර නිවාරණ ධාරිතා ගොඩ නැංවීමේ පුහුණුව (දේශීය වෛද්‍ය ආයතනය)

59 & 60	මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරීන් සඳහා පැවැත්වූ වැඩසටහන
61 & 62	බස්රථවල 1948 මනෝ උපදේශන සේවා ස්ථිකරය ඇලවීම
63 & 64	ජාතික ප්‍රවාහන කොමිෂන් සභාවේ සහයෝගිතාවයෙන් බස් රථ රියදුරන් හා කොන්දොස්තරවරුන් සඳහා වැඩමුළුව
65 & 66	බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ක්ෂෙත්‍ර නිලධාරීන් සඳහා දුම්කොළ හා මද්‍යසාර නිවාරණය පිළිබඳ වැඩමුළුව

04 අපගේ දැක්ම හා මෙහෙවර

දැක්ම

දුම්කොළ සහ මද්‍යසාරවලින් තොර දේශයක් සහ මහජනතාවක්



මෙහෙවර



දුම්කොළ සහ මද්‍යසාර පාදක කොට ගත් උපද්‍රවයන්ගෙන් අපගේ සමාජය නිදහස් කරගැනීම සඳහා සියලු සමාජීය අංශ එකරාශී කිරීම

05 ආයතනික තොරතුරු

සංවිධානයේ නම

දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය

නෛතික ස්වරූපය

2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත යටතේ 2006 වසරේදී ස්ථාපිත කරන ලදී.

ලියාපදිංචි කාර්යාලය

11වන මහල, A කොටස, සෙත්සිරිපාය අදියර II, බත්තරමුල්ල

අධ්‍යක්ෂ මණ්ඩලය

මහාචාර්ය සමාධි රාජපක්ෂ මයා	- සභාපති
පූජ්‍ය ඇල්ලේ ගුණවංශ හිමි	- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
වෛද්‍ය ලක්ෂ්මි සෝමතුංග මිය	- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
බී.එම්.එස්. බණ්ඩාර මිය	- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
ආර්.පී. සත්කුමාර මයා	- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
හිරන්‍යා පෙරේරා මිය	- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
කමණී ගුණරත්න මිය	- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
එම්.අයි. ගුණසිරි මයා	- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
සුධීර ජයරත්න මයා	- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
ශාක්‍ය නානායක්කාර මයා	- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
එල්.ලක්මාල් සිල්වා මයා	- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
සුනිල් ශාන්ත වීරසේකර මයා	- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
සුමිත් අබේසිංහ මයා	- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
විජයාණී රත්නායක මිය	- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

විගණකවරු

විගණකාධිපති, අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල

බැංකුව

ලංකා බැංකුව

කළමනාකරණ කමිටුව

මහාචාර්ය සමාධි රාජපක්ෂ මයා	- සභාපති
අනුෂිකා කෝරළගේ මිය	- ගණකාධිකාරී
විරාජ් බණ්ඩාරනායක මයා	- නීති නිලධාරී
චානිකා රණතුංග මෙනෙවිය	- පරිපාලන නිලධාරී

06 අරමුණු

අධිකාරියේ ප්‍රධාන අරමුණු වනුයේ:

- මහජන සෞඛ්‍ය ආරක්ෂණය සඳහා දුම්කොළ සහ මද්‍යසාර (සහ අනෙකුත් මත්ද්‍රව්‍ය) හා සම්බන්ධ පුළුල් සහ විශේෂිත ක්‍රියාමාර්ග හඳුනා ගැනීම.
- නිෂ්පාදනය, අලෙවිකරණය, ප්‍රචාරණය සහ දුම්කොළ සහ මද්‍යසාර ආශ්‍රිත නිෂ්පාදන පරිභෝජනය පිළිබඳව ඇගයීම් සහ අධීක්ෂණය කිරීම තුළින් දුම්කොළ සහ මද්‍යසාර ආශ්‍රිත හානි වැළැක්වීම.
- දුම්කොළ සහ මද්‍යසාර ආශ්‍රිත නිෂ්පාදන වෙත ප්‍රවේශවීමට ඇති අවස්ථා අවම කිරීමෙන් පුද්ගලයන්, විශේෂයෙන්ම ළමුන් දුම්පානයෙන් හෝ මද්‍යසාර භාවිතා කිරීම අධෛර්යමත් කරනු ලබන විධිවිධාන සැකසීම.
- සුපිරිසිදු වාතාශ්‍රය රැක ගැනීම පිළිබඳ නීති සකස් කිරීම, සම්මත කරගැනීම, ක්‍රියාවට නැංවීම සහ ලබා ගත හැකි අවකාශ සීමා කිරීම මගින් ප්‍රජාව දුම්කොළ සහ මද්‍යසාරවලින් ආරක්ෂා කර ගැනීම.
- දුම්කොළ හා මද්‍යසාර මගින් ජනතාවට සිදු කරන හානිය වළක්වා ගැනීම සඳහා දුම්කොළ සහ මද්‍යසාර නිවාරණ වැඩසටහන් හා වෙනත් උපායමාර්ග යෝජනා කිරීම හා ක්‍රියාවට නැංවීම.

අධිකාරියේ ප්‍රධාන කර්තව්‍ය වනුයේ

- දුම්කොළ නිෂ්පාදන හා මද්‍යසාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුවට උපදෙස් දීම.
- ජනමාධ්‍ය අනුග්‍රාහකත්වයෙන් සහ ප්‍රජා මූලික වැඩසටහන් මගින් සෞඛ්‍ය වර්ධනය දිරි ගැන්වීම සහ සහාය වීම.
- දුම්කොළ නිෂ්පාදන හා මද්‍යසාර නිෂ්පාදන පරිභෝජනයෙන් උද්ගත වන හානිය අවම කර ගැනීම සඳහා උපාය මාර්ග නිර්දේශ කිරීම.
- අනීතික ඖෂධ භාවිතය වැළැක්වීම හෝ අවම කිරීම සඳහා ජාතික අන්තරායකාරී ඖෂධ පාලක මණ්ඩලය විමසා වැඩපිළිවෙල් සකස් කිරීම.
- දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන නීතිමය, බදුකරණ, පරිපාලන සහ අනෙකුත් අවශ්‍ය ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.
- ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳ සමීක්ෂණ හා ඇගයීම් කිරීම.
- ප්‍රතිපත්තිවල ගැටලු සමීක්ෂණය කිරීම අවශ්‍ය විය හැකි පරිදි ප්‍රතිපත්තිවල යම් වෙනස්කම් ඇති කිරීමට රජයට උපදෙස් ලබාදීම.
- දුම්කොළ හා මද්‍යසාර සම්බන්ධ ගැටලු පිළබඳ පර්යේෂණ දිරිගැන්වීම සහ ඊට සහාය වීම.
- දුම්කොළ නිෂ්පාදන හා මද්‍යසාර නිෂ්පාදන සැකසීම, පරිභෝජනය හා අලෙවියට අදාළ ආර්ථික, සෞඛ්‍ය හා වෙනත් ගැටලු සමීක්ෂණය කිරීම.
- දුම්කොළ හා මද්‍යසාර පාවිච්චිය හා සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම හා ප්‍රවර්ධනය හා සම්බන්ධීකරණය.
- දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහි ලා අවශ්‍ය රාජ්‍ය හෝ රාජ්‍ය නොවන නියෝජිතායතන සහ පෞද්ගලික අංශයේ සංවිධානවල සහභාගිත්වය ලබා ගැනීම.
- දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ සමීක්ෂණය කිරීම සම්බන්ධයෙන් ක්‍රියාකාරී ප්‍රජා සහභාගිත්වය දිරිගැන්වීම.
- දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ අදාළ ගැටලු පිළිබඳව මහජනයාගෙන් තොරතුරු භාරගැනීම සහ ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට අදාළ ආයතනවලට නිර්දේශ කිරීම.
- දුම්කොළ නිෂ්පාදන හා මද්‍යසාර නිෂ්පාදන සැකසීම හා පරිභෝජනය තුළින් උද්ගත වන හානිය අවම කිරීම සම්බන්ධයෙන්, රාජ්‍ය සහ රාජ්‍ය නොවන නියෝජිත ආයතන හා සංවිධාන විසින් කරගෙන යන සියලු කටයුතුවල සම්බන්ධීකරණ නියෝජිත ආයතනය ලෙස කටයුතු කිරීම.
- දුම්කොළ හා මද්‍යසාර ආශ්‍රිත සියලු විමර්ශනවල ප්‍රගතිය අධීක්ෂණය කිරීම.
- දුම්කොළ හා මද්‍යසාර ආශ්‍රිත ගැටලු සම්බන්ධයෙන් දේශීය, කලාපීය සහ අන්තර්ජාතික සංවිධාන සමඟ සම්බන්ධීකරණය ඇති කිරීම.

07 සභාපතිවරයාගේ සමාලෝචනය



අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා වාර්ෂික වාර්තාව සහ විගණිත මූල්‍ය තත්ත්වය පිළිබඳ මූල්‍ය ප්‍රකාශනය, විගණකාධිපති වාර්තාව මා ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි.

දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (දු.ම.ජා.අ.) 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත යටතේ 2006 වසරේදී ස්ථාපිත කරන ලදී. දු.ම.ජා.අ. ශ්‍රී ලංකාවේ දුම්කොළ හා මද්‍යසාර නිවාරණයේ කේන්ද්‍රස්ථානයයි.

කාර්යසාධනය

2006 අංක 27 දරන දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත යටතේ බලයලත් නිලධාරීන් සහ අධිකාරිය නීතිමය ක්‍රියාමාර්ග 1101ක් ගෙන ඇත. මද්‍යසාර සහ දුම්කොළ නිවාරණය හා වැලැක්වීම පිලිබඳ සහතික පත්‍ර මනෝ උපදේශන පාඨමාලාව (දෙවන කණ්ඩායම) සඳහා සිදු කිරීමට අධිකාරියට හැකි වූ අතර සහභාගිවන්නන් 61 දෙනෙකු සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව නිමකර සහතිකපත් ලබා ගත්හ. ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය සමඟ එක්ව දුම්කොළ සහ මද්‍යසාර නිවාරණය හා වැලැක්වීම පිළිබඳ සහතික පත්‍ර මනෝ උපදේශන පාඨමාලාව ආරම්භ වූ අතර සහතික පත්‍ර පාඨමාලාව සඳහා අයදුම්කරුවන් 29 දෙනෙකු සහභාගී විය. සහතිකලත් උපදේශකවරුන් සඳහා සමාලෝචන රැස්වීම් ද පවත්වන ලදී. අධිකාරිය වෙත 1948 උපකාරක සේවාව හරහා 2022 දී මුළු ඇමතුම් 18,422 ක් ලැබුණු අතර උපදේශන ඇමතුම් 3,666 ක් තිබුණි.

යෞවන හා ක්‍රීඩා අමාත්‍යාංශයේ කුඩා ව්‍යවසායක අංශයට අනුයුක්ත ක්ෂේත්‍ර නිලධාරීන් 150 දෙනෙකුට ගම්පහ, කළුතර, කොළඹ සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල දුම්කොළ සහ මද්‍යසාර නිවාරණය පිළිබඳව පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

මද්‍යසාර සහ දුම්කොළ නිවාරණය සහ වැලැක්වීම පිළිබඳ විද්‍යාත්මක තොරතුරු වාර්ෂිකව දුම්කොළ සහ මද්‍යසාර වැළැක්වීම පිළිබඳ ජාතික සම්මන්ත්‍රණයේදී (NSTAP) ප්‍රචාරණය කරනු ලැබේ. මද්‍යසාර සහ දුම්වැටි භාවිතයෙන් ආර්ථිකයට සහ සෞඛ්‍යයට සිදුවන බලපෑම්, පාරිසරික තිරසාරභාවය සහ මද්‍යසාර සහ දුම්කොළ පාලනය, මද්‍යසාර සහ දුම්කොළ පාලනයේ නීතිමය අංග, මද්‍යසාර වල සමාජීය බලපෑම් සහ දුම්කොළ භාවිතය, සහ මත්පැන් සහ දුම්කොළ භාවිතය වැළැක්වීම සහ නැවැත්වීම ඇතුළු තේමා හයකට ඇතුළත් සාරාංශ විසි එකකින් (21) මෙවර සමුළුව සමන්විත විය.

දුම්කොළ සහ මද්‍යසාර ආශ්‍රිත අංශ පිළිබඳ පර්යේෂණවල විශ්වසනීයත්වය සහ ගුණාත්මකභාවය සහතික කිරීම සහ දුම්කොළ හා මත්පැන් කර්මාන්ත අරමුණුවලට අනුකූලව පර්යේෂණ සිදු කිරීමට ඉඩ නොදීම අරමුණු කරගනිමින් 2022 දී ආචාර ධර්ම සමාලෝචන කමිටුවක් (ERC-NATA) පිහිටුවීමට අධිකාරියට හැකි විය.

2022 වසරේදී සෞඛ්‍ය පණිවිඩ හැටක් (60) සකස් කොට ප්‍රධාන භාෂා තුනට පරිවර්තනය කරන ලදී. ISBN අංකය, 978-624-5719-43-3 සහිත සෞඛ්‍ය පණිවිඩ පොත් පිංචක් ප්‍රකාශයට පත් කරන ලදී. එසේ සකස් කරන ලද පණිවිඩ සංචිතයේ ඇතැම් සෞඛ්‍ය පණිවිඩ 10 ශ්‍රේණියේ සිංහල මාධ්‍ය විද්‍යා පෙළ පොතේ සහ 11 ශ්‍රේණියේ දෙමළ මාධ්‍ය විද්‍යා පෙළපොතෙහි ඇතුළත් කර ඇත.

අධ්‍යාපන ආයතන පරිශ්‍ර දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන, මද්‍යසාර සහ වෙනත් මත්ද්‍රව්‍ය භාවිතයෙන්, ප්‍රවර්ධනයෙන් සහ වෙළඳාමෙන් තොර කලාපයක් බවට පත් කිරීම සම්බන්ධයෙන් 2020 ජූලි 29 වන දින අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අංක 20/2020 චක්‍රලේඛය නිකුත් කරන ලදී. දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය ද ප්‍රධාන පාර්ශවකරුවකු ලෙස මෙම චක්‍රලේඛය මගින් පිළිගෙන ඇත. අධ්‍යාපන ආයතන විසින් මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීමේ මට්ටම තක්සේරු කිරීම සඳහා අධිකාරිය විසින් ඇගයීමක් සිදු කරන ලදී.

මොනරාගල සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල දුම්කොළ වගාව සඳහා විකල්ප භෝග පිළිබඳව කෘෂිකර්ම නිලධාරීන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීම සඳහා වැඩමුළුවක් පවත්වන ලදී.

2022 වර්ෂයේදී අධිකාරියේ ෆෙස්බුක් පිටුවට අනුසැරියන් තුන්දහස් නවසියයක් (3900) සිටියේය. ෆෙස්බුක් පිටු ප්‍රවේශය මසකට 676,334 සහ 150,000 අතර වෙනස් වී ඇත. යූ ටියුබ් ග්‍රාහකයින් එකසිය හැට හතක් (167) සිටි අතර ජනතාව දැනුවත් කිරීම සඳහා වීඩියෝ ක්ලිප් හයක් යූ ටියුබ් වෙත උඩුගත කර ඇත. දුම්කොළ සහ මද්‍යසාර පාලනය සම්බන්ධයෙන් මාධ්‍ය සාකච්ඡා හතරක් පවත්වන ලදී. මද්‍යසාර හා දුම්කොළ නිවාරණය සම්බන්ධයෙන් පුවත්පත් වල ලිපි 187ක් පළ විය. සභාපතිවරයා ගුවන්විදුලි වැඩසටහන් 23කට සහභාගි වෙමින් ජනතාව දැනුවත් කිරීමට දායක විය. සමාජ මාධ්‍ය පිටු සහ බ්ලොග් වල ප්‍රවෘත්ති 45ක්, සහ දුම්කොළ සහ මද්‍යසාර සම්බන්ධ ප්‍රවෘත්ති පළ කර ඇත.

චිත්‍රපට 22ක් සමාලෝචනය කරන ලද අතර, ඉන් 11ක් මත්පැන් සහ දුම්වැටි දර්ශන ඇතුළත් කරමින් දු.ම.ජා.අ. පනත උල්ලංඝනය කර ඇති බව අනාවරණය කර ගන්නා ලදී. නිසි පියවර ගන්නා ලෙස ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයට දැනුම් දී ඇත.

ශ්‍රී ලංකාවේ දුම්කොළ සහ මද්‍යසාර නිවාරණයේ කේන්ද්‍රස්ථානය වන දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (NATA) ශ්‍රී ලංකාවේ දුම්කොළ සහ මද්‍යසාර නිවාරණය සඳහා ශ්‍රී ලංකාවේ මාධ්‍යවේදීන් දක්වන දායකත්වය අගය කිරීමේ අරමුණින් ඔවුන් සඳහා උද්දේශන වැඩසටහනක් සංවිධානය කරන ලදී.

අධිකාරිය විසින් V NATA මාධ්‍ය යෙදුම හරහා මාධ්‍ය උල්ලංඝනය කිරීම් පිළිබඳ තොරතුරු/විමසුම් රැස් කර ඇති අතර එම විමසීම් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. මෙම ජංගම දුරකථන මෘදුකාංගය හරහා 2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මහජන පැමිණිලි 200 කට අධික සංඛ්‍යාවක් ලැබී ඇත. V NATA බලයලත් නිලධාරීන් හරහා ලියාපදිංචි වූ මුළු නිලධාරීන් (සේවකයින්) සංඛ්‍යාව 213 ක් වූ අතර ලැබුණු මුළු වාර්තා සංඛ්‍යාව 32 කි.

2022 පෙබරවාරි 3 වන දින පැවති ලෝක සෞඛ්‍ය සංවිධානයේ පාර්ශවකරුවන්ගේ සම්මේලනය (COP) සහ පාර්ශව සාමාජික (MOP) රැස්වීම්වලදී මම ශ්‍රී ලංකාව නියෝජනය කළ අතර 2022 නොවැම්බර් 21 සිට 25 දක්වා පවත්වන ලද COP9 සහ MOP2 තෝරා පත්කර ගන්නා ලද කාර්යාංශයේ දෙවන ඒකාබද්ධ රැස්වීම සඳහා සහභාගී වුණි.

දුම්කොළ වලින් තොර කලාප යළි සක්‍රීය කිරීම සඳහා බලයලත් නිලධාරීන් සඳහා පළාත් වැඩමුළු නවයක් පවත්වන ලදී. දුම්කොළ මුක්ත කලාප මාස හයකට පසු නැවත සක්‍රීය කරන ලද අතර, අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඇගයීමට ලක් කරන ලද අතර ක්‍රියාත්මක වන දුම්කොළවලින් තොර කලාප 230 කට ආසන්න ප්‍රමාණයක් හඳුනා ගන්නා ලදී. පසුව අධිකාරිය විසින් දුම්කොළවලින් තොර කලාප නිර්මාණය කිරීමට සම්බන්ධ වූ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට පහසුකම් සැපයීම සඳහා සමාලෝචන රැස්වීමක් සංවිධානය කරන ලදී. තවද, අධිකාරිය විසින් දුම්කොළවලින් තොර කලාප පිහිටුවීම පිළිබඳ සිද්ධි අධ්‍යයන පොතක් ප්‍රකාශයට පත් කරන ලදී.

දු.ම.ජා.අ විසින් මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීන් සඳහා දුම්කොළ සහ මද්‍යසාර නිවාරණය සඳහා ප්‍රජා සහභාගීත්වය ඉහළ නැංවීම පිළිබඳ පුහුණුවක් පවත්වන ලදී.

අධිකාරිය, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සමඟ එක්ව සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ සිසුන් සඳහා දැනුම වැඩි දියුණු කිරීමේ වැඩසටහනක් විශ්වවිද්‍යාල රෝහල් ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

මානව සම්පත් සංවර්ධනය

2022.12.31 වන විට ගණකාධිකාරිවරයෙකු, නීති නිලධාරියෙකු, පරිපාලන නිලධාරියෙකු, පර්යේෂණ නිලධාරීන් 02 දෙනෙකු, සංවර්ධන නිලධාරීන් 06 දෙනෙකු (දෙදෙනෙක් කොන්ත්‍රාත් පදනම මත), කළමනාකරණ සහකාරවරයෙකු, කම්කරුවන් දෙදෙනෙකු සහ රියදුරන් දෙදෙනෙකු ඇතුළුව අධිකාරියෙහි සේවකයින් 18 දෙනෙකු සිටියේය. සේවකයන් විසින් ඉල්ලා සිටි මූලික සුබසාධන පහසුකම් අධිකාරිය නොකඩවා ලබා දුණි.

ස්තුතිය

දුම්කොළ සහ මද්‍යසාර ආශ්‍රිත මූලාරම්භයන් රට තුළ අඛණ්ඩව පවත්වාගෙන යාමට නායකත්වය ලබා දීම සඳහා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය කෙරෙහි විශ්වාසය තැබීම සහ මගපෙන්වීම සම්බන්ධයෙන් ගරු සෞඛ්‍ය අමාත්‍ය, වෛද්‍ය කෙහෙළිය රඹුක්වැල්ල මහතාට මාගේ බලවත් කෘතඥතාව හිමි වේ. බොනොවන රෝග සංදර්භය තුළ සහ සෞඛ්‍ය පිළිබඳ සමස්ත ඉදිරි දර්ශනය තුළ දුම්කොළ සහ මද්‍යසාර පාලනයේ අදාළත්වය සහ වැදගත්කම එයින් විද්‍යමාන වේ. තීරණ ගැනීමේ ක්‍රියාවලියේ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ක්‍රියාමාර්ග රැසක් ක්‍රියාත්මක කර ඇති සෞඛ්‍ය ලේකම්වරයා ඇතුළු අමාත්‍යාංශයේ අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, අපගේ යෝජනා හා සැලසුම්වලට මැනවින් ප්‍රතිචාර දැක්වූ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්ට මාගේ නොමද ස්තුතිය පිරි නමන්නෙමි. සැබෑ හවුල්කරුවන් ලෙස ඔවුන් දැක්වූ ක්ෂණික සහාය අධිකාරියේ කටයුතු සඳහා බොහෝ සෙයින් ඉවහල් විය. අමාත්‍යාංශයේ නොමද සහය හේතුවෙන් දුම්කොළ සහ මධ්‍යසාර පාලනය සම්බන්ධයෙන් නවෝත්පාදක වැඩසටහන් රැසක් දියත් කිරීමට දු.ම.ජා.අධිකාරියට හැකි වී ඇති අතර, ඒවායින් බහුතරයක් මෙම වාර්තාවෙහි විශේෂිතව දක්වා ඇත.

තම කර්තව්‍යයන් සඵල ආකාරයෙන් ඉටු කිරීම පිණිස අධිකාරිය අනුකමිටු හතක් පත් කරනු ලැබීය. දු.ම.ජා.අ. පනත සංශෝධන අනු කමිටුව, දුම්කොළ හා මද්‍යසාර සඳහා බදුකරණ සූත්‍රයක් සකස් කිරීමේ අනුකමිටුව, දුම්කොළ හා මද්‍යසාර නිවාරණය හා වැලැක්වීම පිලිබඳ අනුකමිටුව, දුම්රහිත දුම්කොළ අනුකමිටුව, දුම්කොළ හා මද්‍යසාර නිවාරණය පිළිබඳව වෛද්‍ය අධ්‍යාපනය සඳහා විෂයමාලාව සකස් කිරීමේ අනුකමිටුව, දු.ම.ජා. අධිකාරියේ මාධ්‍ය ප්‍රතිපත්තිය බලාත්මක කිරීමේ ශක්තිමත් කිරීමේ අනුකමිටුව සහ දුම්කොළ වගාව වෙනුවට විකල්ප භෝග හඳුන්වාදීම පිණිස අනුකමිටුව එම අනුකමිටු වේ. පුප්ඵුසීය වෛද්‍ය සංගමය, මනෝචිකිත්සක වෛද්‍ය සංගමය, මුදල් අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය, දේශීය වෛද්‍ය ආයතනය, රජරට විශ්වවිද්‍යාලය, පිළිකා පාලන වැඩසටහන, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, කැළණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, යාපනය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය, සබරගමුව විශ්වවිද්‍යාලය, රුහුණ විශ්වවිද්‍යාලය සහ වයඹ විශ්වවිද්‍යාලය නියෝජනය අනුකමිටු සාමාජිකයන් හට සැබෑ පාර්ශවකරුන් ලෙස ස්ව කැමැත්තෙන් දැක්වූ දායකත්වය හා නොමසුරු සහයෝගය වෙනුවෙන් අපගේ කෘතවේදිත්වය පලකරන්නෙමු.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ දුම්කොළ පාලන ප්‍රඥප්ති රාමු ලේකම් කාර්යාලය සමඟ ලෝ.සෞ.සංවිධානය අතිශයින් විශ්වාසී පාර්ශවකරුවකු වූ අතර ගෝලීය, කලාපීය සහ ජාතික මට්ටමින් අප වෙත නිරායාසයෙන් ලැබෙන සහයෝගය මිල කළ නොහැකිය. ලෝ.සෞ. සංවිධානය සහ දුම්කොළ පාලන ප්‍රඥප්ති රාමු ලේකම් කාර්යාලය වෙතින් අප හට ලැබෙන සම්පත් සහ තාක්ෂණික උපදෙස් අප රට තුළ දුම්කොළ පාලනය සම්බන්ධයෙන් අප ලබා ගත් ජයග්‍රහණ කෙරෙහි වැදගත් දායකත්වයක් ලබා දී තිබේ.

අවසාන වශයෙන්, අධිකාරියේ සාර්ථකත්වය උදෙසා දැක්වූ වටිනා දායකත්වය සහ මඟපෙන්වීම වෙනුවෙන් මාගේ ස්තුතිය අධ්‍යක්ෂ මණ්ඩලයට පිරි නමන්නෙමි

මහාචාර්ය සමාධි ඩබ්ලිව් රාජපක්ෂ
සභාපති
දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය

08 අධ්‍යක්ෂවරු

සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජිතයකු, අධිකරණ අමාත්‍යාංශයේ නියෝජිතයකු, අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජිතයකු, ජනමාධ්‍ය අමාත්‍යාංශයේ නියෝජිතයකු, වෙළඳ අමාත්‍යාංශයේ නියෝජිතයකු, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ නියෝජිතයකු, ජාතික අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සභාපතිවරයා, සුරාබදු කොමසාරිස්වරයාගේ නියෝජිතයකු ලෙස නිල බලයෙන් පත්වන සාමාජිකයක් නව දෙනෙකු සහ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයන් පස් දෙනෙකු ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයන් දහ හතර දෙනෙකුගෙන් සමන්විත වේ.



මහාචාර්ය සමාධි ඩබ්ලිව් රාජපක්ෂ
සභාපති,
දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය



වෛද්‍ය ලක්ෂ්මී සී. සෝමතුංග
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මහජන සෞඛ්‍ය)
සෞඛ්‍ය අමාත්‍යාංශය



බී.එම්.එස්. බණ්ඩාර මිය
අතිරේක ලේකම්
වෙළඳ අමාත්‍යාංශය



ආර්.පී. සත්කුමාර මහතා
අතිරේක ලේකම් (පරිපාලන),
තොරතුරු හා ජනමාධ්‍ය අමාත්‍යාංශය



හිරන්‍යා පෙරේරා මිය
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය

කමණී ගුණරත්න මිය,
අධ්‍යාපන අධ්‍යක්ෂ
අධ්‍යාපන අමාත්‍යාංශය





එම්.ජේ. ගුණසිරි මහතා,
සුරාබදු කොමසාරිස් ජෙනරාල්
සුරාබදු දෙපාර්තමේන්තුව

සුධීර ජයරත්න මහතා
අධ්‍යක්ෂ,
ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය





ශාක්‍ය නානායක්කාර මහතා -(ආරාධිත)
සභාපති,
අන්තරායකාර ඖෂධ පාලක ජාතික මණ්ඩලය



එල්. කමල් සිල්වා මහතා
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති



පූජ්‍ය ඇල්ලේ ගුණවංශ හිමි
ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා විසින් පත්කරන ලදී



සුමිත් අබේසිංහ මහතා
ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා විසින් පත්කරන ලදී



විජයානි රත්නායක මිය
ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා විසින් පත්කරන ලදී



සුනිල් ශාන්ත වීරසේකර මහතා
ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා විසින් පත්කරන ලදී

09 අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

2022 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා ඔවුන්ගේ වාර්තාව සහ විගණනය කරන ලද ගිණුම් අධ්‍යක්ෂ මණ්ඩලය සතුටින් ඉදිරිපත් කරයි.

ප්‍රධාන ක්‍රියාකාරකම්

2022 වසරේ අධිකාරියේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ:

- දුම්කොළ හා මද්‍යසාර කර්මාන්තවල මැදිහත්වීම්වලට එරෙහිව ක්‍රියා කිරීමට සහ අධීක්ෂණය කිරීමට අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ගැනීම
- දුම්කොළ සහ මද්‍යසාර නිපැයුම් නිෂ්පාදනය, පරිභෝජනය සහ අලෙවිය ආශ්‍රිත ආර්ථික, සෞඛ්‍ය සහ වෙනත් ගැටළු නිරීක්ෂණය කිරීම පිණිස ක්‍රියාමාර්ග හඳුනා ගැනීම
- අදාළ පාර්ශ්වයන් සඳහා දුම්කොළ සහ මද්‍යසාර නිවාරණය පිළිබඳ අවශ්‍ය පුහුණුව සහ 1948 උපකාරක දුරකථන සේවාව ශක්තිමත් කිරීම.
- දැනුවත් කිරීම් සහ උද්දේශන වැඩසටහන් සඳහා අධ්‍යාපනික ද්‍රව්‍ය සංවර්ධනය කිරීම
- පර්යේෂකයන් දිරිමත් කිරීම සඳහා දු.ම.ජා.අ. සඳහා ආචාර ධර්ම සමාලෝචන කමිටුවක් පිහිටුවීම
- දුම්කොළ සහ මද්‍යසාර පාලනය පිළිබඳ සම්මන්ත්‍රණය (දුම්කොළ සහ මද්‍යසාර නිවාරණය පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය)
- අක්‍රිය දුම්පානයේ ප්‍රමාණය සහ දුම්කොළ දුම නිසා සිදුවන වායු දූෂණය පිළිබඳව සාමාන්‍ය ජනතාව සහ විශේෂයෙන්ම අදාළ පාර්ශ්ව දැනුවත් කිරීම

අධිකාරියේ සමාලෝචනය

2022 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ මූල්‍ය කටයුතුවල තත්ත්වය 60 වන පිටුවේ ඇති මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා ඇත. මූල්‍ය වර්ෂය තුළ අධිකාරිය පිළිබඳ ඇගයීමක් 11 සහ 12 පිටුවල සභාපතිගේ සමාලෝචනයේ අන්තර්ගත වේ.

අනාගත සංවර්ධනය

ආයතනයේ අනාගත සංවර්ධනය සම්බන්ධයෙන් තොරතුරු 11 වන පිටුවෙහි සභාපතිගේ සමාලෝචනයේ දක්වා ඇත.

දේපළ, පිරියත හා උපකරණ

වර්ෂය තුළ පිරියත, යන්ත්‍රෝපකරණ හා උපකරණවල සංචලන 60 වන පිටුවේ ඇති මූල්‍ය ප්‍රකාශනවල සටහන 14 යටතේ දක්වා ඇත.

ගිණුම්කරණ ප්‍රතිපත්ති

පිටු අංක 64 සිට 66 හි මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ අධිකාරියේ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති විස්තර කොට ඇත.

ප්‍රවර්තන ව්‍යාපාරය

ප්‍රවර්තන ව්‍යාපාර සංකල්පය මත පදනම්ව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත. පූර්වේක්ෂිත අනාගතයේ සිය මෙහෙයුම් පවත්වාගෙන යාම ප්‍රමාණවත් සම්පත් අධිකාරිය සතු බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත් වේ.

විගණකවරුන් පත්කිරීම

1971 මූල්‍ය පනතේ විධිවිධාන ප්‍රකාරව, අධිකාරියේ විගණක වනුයේ විගණකාධිපතිවරයා වන අතර 2022 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා අධිකාරියේ මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳව ඔහු වාර්ෂික විගණනයක් සිදු කර ඇත.

මහාචාර්ය සමාධි ඩබ්ලිව් රාජපක්ෂ
සභාපති
දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය

10 විගණන කමිටුවේ වාර්තාව

විගණන කමිටුවේ වාර්තාව -2022

විගණන කමිටුව 2010.12.14 දිනැති අංක PED 55 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව සිය රාජකාරී ඉටු කරන ලදී.

ඉහත චක්‍රලේඛය අනුව, අදාළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ අනෙකුත් අදාළ නෛතික අවශ්‍යතාවලට අනුකූලව මූල්‍ය වාර්තාකරණය සිදු කරනු ලබන බව සහතික කිරීම, අබණ්ඩව සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම සමගින් අනුකූල නොවීම පිළිබඳ කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කිරීම සඳහා අදාළ නීති, රෙගුලාසි සහ රජය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කර ඇති බවට වග බලා ගැනීම සහ අභ්‍යන්තර/ බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි සමාලෝචනය කිරීම සහ ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පද්ධති ක්‍රියාත්මක කිරීම සහතික කිරීම පිණිස විගණන කමිටුව අධීක්ෂණ කාර්යයේදී මණ්ඩලයට සහාය විය යුතුය.

විගණන කමිටුව අධිකාරියේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වූ අතර වසර තුළ එහි සභාපතිත්වය දරන ලද්දේ වෙළඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයා විසිනි. භාණ්ඩාගාර නියෝජිතයා ලෙස ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු විගණන කමිටුවේ සාමාජිකයකු ලෙස සහභාගි විය.

ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරිවරයකු සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක නිරීක්ෂකයකු ලෙස සහභාගි විය. ආරාධනා කරනු ලැබූ විටදී දු.ම.ජා.අධිකාරියේ සභාපති සහ අදාළ නිලධාරීන් විගණන කමිටු රැස්වීම් සඳහා සහභාගි විය.

2022 මූල්‍ය වර්ෂය තුළදී 2022 ජූනි මස 01, 2022 සැප්තැම්බර් 15, 2022 ඔක්තෝබර් 19 සහ 2022 දෙසැම්බර් 06 යන දිනවල දී විගණන කමිටු රැස්වීම් හතරක් (04) පවත්වන ලදී.

2022 වසරේදී කමිටුව

- ගැටලුවල ස්වභාවය, කළමනාකාරිත්වයේ ප්‍රතිචාරය සහ අවධාරණය කරනු ලැබූ ඌනතා මග හරවාලීම පිණිස ගනු ලැබූ නිවැරැදි කිරීමේ ක්‍රියා මාර්ග ආවරණය කරමින්, 2022 පෙබරවාරි මාසයේදී නිකුත් කරනු ලැබූ 2021 වසර සඳහා වූ ඇතැම් විගණන වාර්තා සලකා බලන ලදී.
- කමිටුවේ නිර්දේශ මත අදාළ නිලධාරීන් විසින් ගනු ලැබූ පසු විපරම් ක්‍රියාමාර්ග සමාලෝචනය කරන ලදී.
- 2021 වර්ෂයට අදාළව විගණකාධිපති විසින් මතු කරනු ලැබූ විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දී ඇත්දැයි සලකා බලා සුදුසු නිර්දේශ ඉදිරිපත් කරන ලදී.
- 2021 වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තා සමාලෝචනය කර අඩුපාඩු නිවැරැදි කිරීම, නීති රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම, මානව සම්පත් කළමනාකරණය, ප්‍රසම්පාදනය සහ එහි සඳහන් කොන්ත්‍රාත් පරිපාලනය සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියා මාර්ග සලකා බලන ලදී.

විගණන කමිටු සාමාජිකයන්

සභාපති	-	බී.එම්.එස්. බණ්ඩාර මිය, වෙළඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්
		අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්- ආර්.පී. සත්කුමාර මහතා, තොරතුරු හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අතිරේක - ලේකම් සුධීර ජයරත්න මහතා, අධ්‍යක්ෂ, ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය
භාණ්ඩාගාර නියෝජිත	-	කේ.ඩී.එස්.ආර්. පෙරේරා මහතා, අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල්, ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව
ප්‍රධාන අභ්‍යන්තර විගණක	-	ආර්.එම්.එස්. වසන්ත මහතා
විගණන අධිකාරී	-	එස්.යූ.ඩී. මානවසිංහ මහතා

බී.එම්.එස්. බණ්ඩාර
අතිරේක ලේකම්, වෙළඳ අමාත්‍යාංශය
සභාපති - විගණන කමිටුව
07.02.2023

11 ආයතනික පාලන වාර්තාව

අධිකාරියේ පාලනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.

අධ්‍යක්ෂවරු

අධ්‍යක්ෂ මණ්ඩලය එක් විධායක අධ්‍යක්ෂවරයෙකු,විධායක නොවන අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකුගෙන් සහ නිල බලයෙන් පත්වන නව දෙනෙකුගෙන් සමන්විත වන අතර විධායක අධ්‍යක්ෂවරයා වන්නේ සභාපතිවරයාය. සමාලෝචිත කාල සීමාව වන 2022 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දොළහක් පවත්වන ලදී.

කළමනාකරණ කමිටුව

අධිකාරියේ කළමනාකරණ කමිටුවේ ප්‍රධානත්වය අධිකාරියේ සභාපතිවරයා විසින් දරනු ලබයි. කමිටුව සාමාන්‍යාධිකාරී, ගණකාධිකාරී, නීති නිලධාරී සහ පරිපාලන නිලධාරීන්ගෙන් සමන්විත වේ.

කළමනාකරණ කමිටුව අධිකාරියේ දෛනික ක්‍රියාකාරකම් පිළිබඳ තීරණ ගැනීම, ප්‍රතිපත්ති තීරණ සහ උපාය මාර්ගික අරමුණු ක්‍රියාත්මක කිරීම මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලයට ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කරයි.

විගණන කමිටුව

විගණන කමිටුව සංස්ථාපනය කර ඇත්තේ යහපාලනය සඳහා වන රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ. සහ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අනුව ය.

විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලබන අතර අධිකාරියේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. වෙළඳ අමාත්‍යාංශය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා කමිටුවේ සභාපතිත්වය දරයි.

විගණන කමිටුව අධිකාරියේ ක්‍රියාකාරකම් ස්වාධීනව පරීක්ෂා කර ඇගයීමට ලක් කරයි. අධිකාරියේ අභ්‍යන්තර විගණන කාර්යය සෞඛ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය ඔවුන්ගේ "අභ්‍යන්තර විගණන සැලැස්ම" අනුව සිදු කරනු ලබයි.

සමාලෝචිත කාල සීමාව තුළ විගණන කමිටු රැස්වීම් හතරක් පවත්වන ලදී.

විගණන කමිටු වාර්තාව 15 පිටුවේ දක්වා ඇත.

ආයෝජක සබඳතා හා මහජන වගවීම

මහජනතාව වෙනුවෙන් අධිකාරි ස්ථාපිත කොට හිමිකාරිත්වය දරා මෙහෙයවනු ලබන්නේ රජය විසිනි. එබැවින්, අධිකාරියේ කළමනාකරණය සම්බන්ධයෙන් එහි අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකරුවන් රෙබීය අමාත්‍යාංශය වන සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත සහ මුදල් අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරය වෙත වගකිව යුතු වේ.

ඉහත වගකීම ඉටු කරමින් වාර්ෂික වාර්තාව, වාර්ෂික ගිණුම්, වාර්ෂික අයවැය, කාර්තුමය කාර්ය සාධන වාර්තාව එම බලධාරීන් වෙත යොමු කෙරේ.

ප්‍රජාතන්ත්‍රවාදී ලෝකය පුරා, මහජන ඡන්දයෙන් තේරී පත් වූ නියෝජිතයන්ගෙන් සමන්විත පාර්ලිමේන්තුව, රාජ්‍ය මුදල් පිළිබඳ අත්‍යන්ත අධිකාරිය ලෙස පිළිගෙන ඇත.

අධිකාරියේ කාර්ය සාධනය, මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තාව ඇතුළත් වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සමාලෝචනය සඳහා පාර්ලිමේන්තුවේ සභාගත කෙරේ.

පොදු ව්‍යවසායයක් වන බැවින්, අධිකාරිය පාර්ලිමේන්තුවේ "පොදු ව්‍යවසායන් සඳහා වූ කාරක සභාව" (COPE) සඳහාද වගකිව යුතුය.

පාරිශ්‍රමික ප්‍රතිපත්තිය

මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත අධිකාරියේ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය සකසා ඇත. අධ්‍යක්ෂවරුන්ගේ දීමනා මහා භාණ්ඩාගාරය විසින් අදාළ චක්‍රලේඛවලට අනුකූලව ගෙවනු ලැබේ. මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වැටුප් පරිමාණයන් මත සේවකයින්ගේ වැටුප් ගෙවනු ලැබේ.

අභ්‍යන්තර පාලනය

අධිකාරිය විසින් සිදු කරනු ලබන සියලුම ගණුදෙණු නිසි පරිදි අනුමත කර, වාර්තාගත කර ඇති බවට සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා නිර්මාණය කර ඇති අභ්‍යන්තර පාලන පද්ධතියක් අධිකාරිය විසින් පවත්වාගෙන යන බව සහතික කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයට ඇත.

කෘත්‍යාත්මක ආයතනික ව්‍යුහය ක්‍රියාත්මක වේ. කාර්ය මණ්ඩලය සාමාන්‍යාධිකාරී, ගණකාධිකාරී, නීති නිලධාරියෙකු, පරිපාලන නිලධාරියෙකු, පර්යේෂණ නිලධාරීන් දෙදෙනෙකු, සංවර්ධන නිලධාරීන් හය දෙනෙකු (ස්ථිර තනතුර 04, කොන්ත්‍රාත් පදනම 02), උපදේශකයින් දෙදෙනෙකු (කොන්ත්‍රාත් පදනම), කළමනාකරණ සහකාරවරයකු, කම්කරුවන් දෙදෙනෙකු සහ රියදුරන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ. සෑම නිලධාරියෙක්ම සභාපතිවරයාට සහ සාමාන්‍යාධිකාරීවරයාට වාර්තා කරයි. සාමාන්‍යාධිකාරීවරයා සභාපතිවරයාට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි.

ගණුදෙණු වල විනිවිදභාවය පවත්වා ගැනීමටත් එමගින් උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට සමාන අවස්ථා ලබා දීම සඳහාත් අධිකාරිය විසින් ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කරනු ලැබේ.

ප්‍රාග්ධන අයවැය ඇතුළත් වාර්ෂික අයවැය මණ්ඩලය විසින් අනුමත කර සෞඛ්‍ය හා මුදල් අමාත්‍යාංශයේ අමාත්‍යාංශ වෙත යොමු කරනු ලැබේ.

12 2022 වර්ෂයේ ප්‍රගතිය (2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා)

12.1 නෛතික ක්‍රියාමාර්ග

12.1.1 බලයලත් නිලධාරීන් විසින් ගත් නෛතික ක්‍රියාමාර්ග

බලයලත් නිලධාරීන් විසින් දු.ම.ජා.අ. පනත යටතේ නඩු පැවරීම් සිදුකර ඇත.

වගුව 1. දු.ම.ජා.අ. පනත යටතේ සුරාබදු නිලධාරීන් පැවැරූ නඩු

වරදේ ස්වභාවය	නඩු පැවරීම් සංඛ්‍යාව
බාල වයස්කරුවන්ට දුම්කොළ විකිණීමේ වරද	96
ප්‍රසිද්ධ ස්ථානවල දුම් පානය කිරීමේ වරද	240
එකතුව	336

වගුව 2: දු.ම.ජා.අ. පනත යටතේ පොලිස් නිලධාරීන් පැවැරූ නඩු

වරද (දු.ම.ජා.අ. පනත අනුව)	පළාත									එකතුව
	බස්නාහිර	මධ්‍යම	උතුරු මැද	උතුරු	නැගෙනහිර	ඌව	මධ්‍යම	දකුණ	සබරගමුව	
31. දුම්කොළ නිෂ්පාදන හෝ මද්‍යසාර නිෂ්පාදන කිසිවක් අවරුදු විසි එකට අඩු තැනැත්තන්ට විකිණීම තහනම් කිරීම	8	1	1	-	-	-	1	9	-	20
32.දුම්කොළ නිෂ්පාදන හෝ මද්‍යසාර නිෂ්පාදන බෙදා හැරීමේ විකුණුම් යන්ත්‍ර සහ ස්වයංසේවා ක්‍රම තහනම් කිරීම	1	-	-	-	-	-	-	-	-	1
33. නියමිත ආකාරයේ දුම්කොළ නිෂ්පාදන සැදීම හෝ අලෙවිය තහනම් කිරීම	-	3	-	-	-	-	110	56	-	169
34. සෞඛ්‍යයට හානිකර බවට අනතුරු හැඟවීමකින් සහ එක් එක් දුම්කොළ නිෂ්පාදනවල අඩංගු තාර, නිකොටින් ප්‍රමාණ පිළිබඳ සඳහන් කිරීමකින් තොරව දුම්කොළ නිෂ්පාදන විකිණීම තහනම් බව	-	-	103	-	-	-	223	3	-	329
35. දුම්කොළ හෝ මද්‍යසාර පිළිබඳ වූ ප්‍රචාරක දැන්වීම් තහනම් කිරීම	-	-	-	-	-	-	-	2	-	2
36.අනුග්‍රාහකත්වය ආදිය තහනම් කිරීම	-	-	-	-	-	-	-	-	-	0
37.දුම්කොළ නිෂ්පාදන හෝ මද්‍යසාර නිෂ්පාදන නොමිලේ බෙදා හැරීම ආදිය තහනම් කිරීම	-	-	-	-	-	-	-	-	-	0
38. දුම්කොළ නිෂ්පාදන හෝ මද්‍යසාර නිෂ්පාදනවල වෙළෙඳ ලකුණුවලට අදාළ වැරදි	-	2	-	-	-	-	-	40	-	42
39. මහජනතාවට ප්‍රවේශ වීමට හැකි ප්‍රදේශවල දුම්පානය කිරීම වරදක් බව	18	28	-	-	5	-	56	66	-	173
43.විවිධ වැරදි	12	3	1	-	-	-	4	9	-	29

12.1.2 අධිකාරිය විසින් ගනු ලැබූ නෛතික ක්‍රියාමාර්ග

ඩන්හිල් ස්විචි

"ඩන්හිල් ස්විචි" සහ "ඩබල් ස්විචි" සම්බන්ධයෙන් දිවයින පුරාම නීති කෘත්‍යයන් ගණනාවක් ආරම්භ කර ඇති අතර රජයේ රස පරීක්ෂකගේ වාර්තාවකට අනුව හෙළිදරව් වී ඇත්තේ අදාළ නිෂ්පාදන 2016 අංක 01 දරන නියෝග උල්ලංඝනය කරන බවය.

එතීමේ කොළ (තෙන්දු කොළ) ආනයනය කිරීම

දු.ම.ජා.අධිකාරියේ අඛණ්ඩ විරෝධතා හේතුවෙන් සෑම අතින්ම සුරුට්ටු හා සමාන කඩදාසි කේතු නිපදවීම පිණිස එතීමේ කොළ (තෙන්දු කොළ) ආනයනය කිරීම නතර කරන ලදී.

ඊ දුම්වැටි

ආනයනිත ඊ දුම්වැටි අත් අඩංගුවට ගෙන රෙගුවේ සහ සුරාබදු දෙපාර්තමේන්තුවේ සහාය ඇති නඩු පවරන ලදී.

දුම්රහිත දුම්කොළ

දුම්රහිත දුම්කොළ චක්‍රලේඛය දැඩිව ක්‍රියාත්මක කරන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටින ලදී.

චිත්‍රපටි

චිත්‍රපටිවල මද්‍යසාර හා දුම් පානය අඩංගු දර්ශන ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් ක්‍රියාමාර්ග ගැනීමෙන් අනතුරුව, සියලු චිත්‍රපටි නිෂ්පාදකයන් දු.ම.ජා.අ. පනතට අනුකූලව කටයුතු කළ යුතු බවට ගරු ජනාධිපතිතුමාගෙන් නියෝගයක් ලබා ගැනීමට අධිකාරිය සමත් විය.

බීඩි පැකට්ටුවල රූපමය සෞඛ්‍ය අවවාද

රූපමය සෞඛ්‍ය අවවාද පළ නොකිරීම හේතුවෙන් බීඩි නිෂ්පාදකයන්ට එරෙහිව නඩු කිහිපයක් පනවන ලදි.

සුපිරි වෙළඳසල් සඳහා මත්පැන් බලපත්‍ර

සුරාබදු දෙපාර්තමේන්තුව විසින් සුපිරි වෙළඳසල් සඳහා මත්පැන් බලපත්‍ර ලබාදීම සම්බන්ධයෙන් පැවරූ නඩුවල අධිකාරිය පාර්ශවකරුවකු විය.

නියෝග

කෙටුම්පත් කරන ලද නව රූපමය සෞඛ්‍ය අවවාද නියෝග සහ විකුණුම් ස්ථාන නියෝග මාලාවක් ගරු සෞඛ්‍ය අමාත්‍යතුමන්ට ඉදිරිපත් කරන ලදී.

කොටු කරන ලද පොදු ස්ථානවල දුම්පානයට එරෙහි ක්‍රියාමාර්ග

දු.ම.ජා.අ. පනතේ 39 වන වගන්තිය උල්ලංඝනය කිරීම හේතුවෙන් සාප්පු සංකීර්ණ හා තරු පහේ හෝටල් ඇතුළුව ස්ථාන කිහිපයකට එරෙහිව ක්‍රියාමාර්ග ගන්නා ලදී.

මද්‍යසාර නිෂ්පාදකයන්ගේ වෙළඳ සළකුණු සහිත පුවරු තිබීමට එරෙහිව ක්‍රියාමාර්ග

බලපත්‍රලාභී පරිශ්‍රයන්හි සිය වෙළඳ සලකුණු ප්‍රදර්ශනය කළ මද්‍යසාර නිෂ්පාදකයන්ට එරෙහිව මෙම වසරේදී අධිකාරිය නඩු පැවැරීමට කටයුතු කරන ලදී.

12.2 දුම්කොළ හා මද්‍යසාර නිවාරණය හා වැළක්වීම පිළිබඳ සහතිකපත්‍ර මනෝඋපදේශන පාඨමාලාව (දෙවන ශිෂ්‍ය කාණ්ඩය)

දුම්කොළ සහ මද්‍යසාර නිවාරණ මනෝඋපදේශනය පිළිබඳ විශේෂ පුහුණුවක් ලැබූ සහතිකපත්‍රධාරීන් 61 දෙනෙකු 1948 දුරකථන මනෝඋපදේශන සේවාවට දායක වෙමින් පැය 24 පුරා දින හතේම නොමිලේ ලබා දෙන සේවාව තවදුරටත් ශක්තිමත් කරයි. මෙම පාඨමාලාව සඳහා දු.ම.ජා.අ. පනත සඳහා බලයලත් නිලධාරීන්, සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරීන්, වරකාපොළ සහ බලංගොඩ රෝහල්වල සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සහ ජාතික යොවුන් සේවා බලකා නිළධාරීන් සහභාගී විය. පුහුණු උපදේශන නිලධාරීන් විසින් දිවයින පුරා දුම්කොළ සහ මද්‍යසාර නිවාරණ වැඩසටහන් පවත්වන ලද අතර සහභාගිවන්නන් 2054 දෙනෙකු පුහුණු උපදේශන නිලධාරීන් විසින් පාඨමාලාව තුළින් ලබාගත් දැනුම සහ අත්දැකීම් තුළින් දැනුවත් කරන ලදී.

දුම්කොළ සහ මද්‍යසාර නිවාරණය හා වැළක්වීම පිළිබඳ සහතික පත්‍ර මනෝඋපදේශන පාඨමාලාව අවසන් කළ සහභාගි වන්නන්ට ලාංඡනයක් හිමි විය. මෙම නිලධාරීන් 1948 දුරකථන මනෝඋපදේශන සේවයේ ස්වේච්ඡා උපදේශකයන් ලෙස සේවයකරයි.. සහතිකපත් ප්‍රදානය කිරීමේ උත්සවය 2022 අගෝස්තු 10 වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණි. සහතිකපත් ප්‍රදානෝත්සවයේ ප්‍රධාන ආරාධිතයා වූයේ ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතාය.

එමෙන්ම උපදේශන පාඨමාලාව ඩිප්ලෝමා මට්ටම දක්වා උසස් කරන ලෙස ඉල්ලමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබීය.







ඡායාරූප 1,2,3: සහතික ප්‍රදානය කිරීමේ උත්සවයේ විශේෂ අවස්ථා

12.3 ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය සමඟ සහයෝගිතාවයෙන් දුම්කොළ හා මද්‍යසාර නිවාරණය හා වැළක්වීම පිළිබඳ සහතිකපත්‍ර මනෝඋපදේශන පාඨමාලාව

ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය සමඟ එක්ව දුම්කොළ සහ මද්‍යසාර නිවාරණය හා වැළක්වීම පිළිබඳ සහතික පත්‍ර මනෝඋපදේශන පාඨමාලාව 2022 සැප්තැම්බර් 25 වැනි දින අනුරාධපුර ශික්ෂණ රෝහලේ මහාචාර්ය ඒකකයේ දී ආරම්භ විය. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය සහ දු.ම.ජා.අ. අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. දු.ම.ජා.අ. පනතේ බලයලත් නිලධාරීන්, අනුරාධපුර ශික්ෂණ රෝහලේ සෞඛ්‍ය කාර්ය මණ්ඩලය, විශ්වවිද්‍යාල සිසුන් සහ දුම්කොළ සහ මද්‍යසාර නිවාරණය පිළිබඳ උනන්දුවක් දක්වන රාජ්‍ය සහ රාජ්‍ය නොවන නිලධාරීන් පාඨමාලාව සමඟ සම්බන්ධ වී සිටියහ. මෙම පාඨමාලාව සඳහා 27 දෙනෙක් සහභාගි වූහ.

12.4 කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සමඟ සහයෝගිතාවයෙන් දුම්කොළ හා මද්‍යසාර නිවාරණය හා වැළක්වීම පිළිබඳ සහතිකපත්‍ර මනෝඋපදේශන පාඨමාලාව

කො.ආ.විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨය සමඟ මූලික සාකච්ඡා පවත්වන ලද අතර යෝජිත විෂය මාලාව විශ්වවිද්‍යාලයේ සනාතන සභාව වෙත යොමු කරන ලදී. දුම්කොළ සහ මද්‍යසාර නිවාරණය පිළිබඳ උනන්දුවක් දක්වන විශ්වවිද්‍යාල සිසුන්ට සහ අනෙකුත් සහභාගිවන්නන්ට මෙම පාඨමාලාවෙන් ප්‍රතිලාභ ලැබෙනු ඇත.

12.5 ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් පවත්වනු ලැබූ ශ්‍රී ලංකාව තුළ දුරකථන මනෝඋපදේශනය පිළිබඳ මාර්ගගත පුහුණු වැඩමුළුව

ලෝක සෞඛ්‍ය සංවිධානයේ විශේෂඥයින් විසින් මෙම වැඩමුළුව පවත්වන ලද අතර සම්පත්දායකයින් වූයේ මහාචාර්ය ස්මිතා දේශපාන්ඩේ, මහාචාර්ය සොනාලි අරෝරා සහ ආචාර්ය ඩොංබෝ ෆූ ය. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, සමෘද්ධි, ගෘහ ආර්ථිකය, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශවල නිලධාරීන් මෙන්ම 12.2 දුම්කොළ හා මද්‍යසාර නිවාරණය හා වැළක්වීම පිළිබඳ උපදේශන සහතිකපත්‍ර මනෝඋපදේශන පාඨමාලාව (දෙවන ශිෂ්‍ය කාණ්ඩය) කාණ්ඩයේ අපේක්ෂකයින් ද සහභාගී වූහ. මෙම පාඨමාලාව 2022 අප්‍රේල් 6-8 දක්වා සූම් තාක්ෂණය භාවිතයෙන් ලබා දෙන ලදී. වැඩසටහන සම්පූර්ණ කළ 65 දෙනෙකුට සහතිකයක් ප්‍රදානය කරන ලදී.

12.6 දුම්කොළ හා මද්‍යසාර නිවාරණය හා වැළක්වීම පිළිබඳ උපදේශන සහතිකපත්‍ර මනෝඋපදේශන (පාඨමාලාවේ පුහුණු උපදේශන නිලධාරීන් සඳහා සමාලෝචන රැස්වීම

රැස්වීමේ අරමුණ වූයේ සහතිකලත් උපදේශන නිලධාරීන් විසින් සම්පූර්ණ කරන ලද උපදේශන කාර්යයන් සමාලෝචනය කිරීමයි. රැස්වීමට සහතිකලත් උපදේශන වෘත්තිකයන් 29 දෙනෙකු පැමිණ සිටියහ.





ඡායාරූප 4 සහ 5: සහභාගිවූවන් වැඩසටහනේ ක්‍රියාකාරකම්වල නියැළෙමින්

12.7 1948 දුරකථන මනෝඋපදේශන සේවාව පිළිබඳ තොරතුරු

වගුව 3: 1948 දුරකථන ඇමතුම් පිළිබඳ විස්තර

මාසය	මුළු ඇමතුම්	උපදේශන ඇමතුම්
ජනවාරි	2044	384
පෙබරවාරි	1300	218
මාර්තු	1676	239
අප්‍රේල්	1642	280
මැයි	2019	237
ජූනි	1374	330
ජූලි	1845	333
අගෝස්තු	1694	486
සැප්තැම්බර්	1367	333
ඔක්තෝම්බර්	1312	335
නොවැම්බර්	1147	261
දෙසැම්බර්	1002	230
මුළු ඇමතුම්	18,422	3,666

මත්පැන් සහ දුම්කොළ භාවිතා කරන්නන්ට ඔවුන්ගේ පුරුදු අත්හැරීමේ ක්‍රමවේදයක් ලබා දීම සඳහා අධිකාරිය විසින් "1948" දුරකථන මනෝඋපදේශන සේවාව දියත් කරන ලදී. මෙම උපදේශන වැඩසටහනේ ඉලක්කය වූයේ දුම්කොළ සහ මද්‍යසාර භාවිතයෙන් ඉවත් වීමට සේවාදායකයින්ට උපකාර කිරීම මෙන්ම මෙම පුරුදු හා සම්බන්ධ ගැටළු සඳහා සහාය ලබා දීමයි. 2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මාසවලට අදාළ ඇමතුම් තොරතුරු ඉහත වගුවේ දක්වා ඇත.

12.8 යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ කුඩා ව්‍යවසාය අංශයේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා උද්දේශන වැඩමුළුව

ගම්පහ, කළුතර, කොළඹ සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල ක්ෂේත්‍ර නිලධාරීන් සහ ව්‍යවසායකයින්ගේ සහභාගීත්වයෙන් මෙම උද්දේශන වැඩසටහන ඔක්තෝබර් 19 සහ දෙසැම්බර් 05 යන දිනවල පැවැත්විණි.



ඡායාරූපය 6: කොළඹ දිස්ත්‍රික්කයේ පැවැත්වූ වැඩසටහන





ජායාරූප 7 සහ 8: කුරුණෑගල දිස්ත්‍රික්කයේ පැවැත්වූ වැඩසටහන

12.9 දු.ම.ජා.අ. පනතට යෝජිත සංශෝධන පිළිබඳ සමාලෝචන රැස්වීම

යෝජිත දු.ම.ජා.අ. පනත් සංශෝධන සහ දු.ම.ජා.අ. අනුකමිටු මගින් සිදු කර ඇති කාර්යයන් සාකච්ඡා කිරීම සඳහා සමාලෝචන රැස්වීමක් පැවැත්විණි. රැස්වීම 2022 දෙසැම්බර් 27 වැනි දින පෙ.ව. 9.00 සිට පස්වරු 1.00 දක්වා වෝටර්ස් එජ්, ඇල්බට් රෝස් ශාලාවේදී පැවැත්විණි. මෙම රැස්වීම සඳහා දු.ම.ජා.අ. අධ්‍යක්ෂ මණ්ඩලය සහ අනුකමිටු සාමාජිකයින් සහභාගී විය. අනුකමිටු සම්බන්ධීකාරකවරුන් විසින් අනුකමිටුවල ප්‍රගතිය ඉදිරිපත් කර දු.ම.ජා.අ. පනත් සංශෝධන සඳහා අදහස් ලබා ගන්නා ලදී.





















ඡායාරූප 9,10,11,12,13,14, 15, 16, 17 හා 18 : අනුකමිටු සම්බන්ධීකාරකවරුන් අනුකමිටුවල ප්‍රගතිය ඉදිරිපත් කරයි

12.10 ශ්‍රී ලංකාවේ දුම්කොළ වගාව වෙනුවට විකල්ප භෝග හඳුන්වාදීම පිළිබඳ නියමු ව්‍යාපෘතියේ පළමු හා දෙවන ඇගයීම්

දුම්කොළ වගාව සඳහා විකල්ප භෝග හඳුන්වාදීම පිළිබඳ නියමු අධ්‍යයනය 2021 වර්ෂයේදී මොණරාගල සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල සිදු කරන ලදී. ව්‍යාපෘතියේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා ඇගයීම් දෙකක් සිදු කරන ලදී. පළමු ඇගයීම පෙබරවාරි මාසයේ (මාස 6 කට පසු) සිදු කරන ලද අතර දෙවන ඇගයීම 2022 අගෝස්තු මාසයේදී (මාස 12 කට පසු) සිදු කරන ලදී.

මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවීන්ගෙන් 38.6%ක් දුම්කොළ වගාව සම්පූර්ණයෙන් නැවැත්වූ බවත්, ගොවීන්ගෙන් 29.8%ක් අර්ධ වශයෙන් එය ඉටුකර ඇති බවත්, විශේෂඥ සහාය ඇතිව දුම්කොළ වගාව නැවැත්වීමට ගොවිපළවලින් 29.8%ක් කැමැත්තෙන් සිටින බවත් මූලික තක්සේරුවේදී අනාවරණය විය. මොණරාගල දිස්ත්‍රික්කයේ දුම්කොළ වගාව සඳහා යොදාගත් ඉඩම් ප්‍රමාණයෙන් 58% ක් භාවිතයෙන් ඉවත් කර ඇත. මෙම දිස්ත්‍රික්කයේ බහුතර ගොවීන් විකල්ප භෝග ලෙස තෝරා ගත්තේ රටකජු සහ කව්පි ය.

පළමු විශ්ලේෂණයේ ප්‍රතිඵලවලට අනුව, ගොවීන්ගෙන් 67.4%ක් දුම්කොළ වගාව සම්පූර්ණයෙන් අත්හැර දැමූ අතර, ගොවීන්ගෙන් 10.51%ක් අර්ධ වශයෙන් දුම්කොළ වැවීම නැවැත්වූ අතර, ගොවිපලවලින් 6.3%ක් සහාය ඇතිව දුම්කොළ වගාව නතර කිරීමට කැමැත්තෙන් සිටින බව පෙන්වා දී ඇත. අනුරාධපුර දිස්ත්‍රික්කයේ දුම්කොළ වගාව සඳහා යොදාගත් භූමියෙන් 92% ක් මේ වන විට භාවිතයෙන් ඉවත් කර ඇත. අනුරාධපුර දිස්ත්‍රික්කයේ බහුතර ගොවීන් විකල්ප භෝග ලෙස තෝරා ගත්තේ එළවළු සහ වී වේ. දෙවන ඇගයීමේදී, ගොවීන්ගෙන් 26%ක් දුම්කොළ වගාව සම්පූර්ණයෙන්ම නැවැත්වූ බවත්, ගොවීන්ගෙන් 23%ක් දුම්කොළ වගාව අර්ධ වශයෙන් නැවැත්වූ බවත්, ගොවිපලවලින් 20%ක් සහ ගොවීන්ගෙන් 9%ක් අලුතින් දුම්කොළ වගාවට සම්බන්ධ වී ඇති බවත් අනාවරණය විය.

දෙවන තක්සේරුවේදී, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවීන්ගෙන් 67.4%ක් දුම්කොළ වගාව සම්පූර්ණයෙන් නැවැත්වූ බවත්, ගොවීන්ගෙන් 10.51% අර්ධ වශයෙන් නවතා දමා ඇති බවත්, ගොවිපලවලින් 6.3%ක් සහයෝගය ඇතිව නතර කිරීමට කැමැත්තෙන් සිටින බවත් අනාවරණය වියෙ

ගොවීන්ගේ අදහසට අනුව බොහෝ ගොවීන් දුම්කොළ වගාව නැවැත්වීමට කැමැත්තක් නොදක්වන්නේ දුම්කොළ කර්මාන්තයෙන් පළිබෝධනාශක සහ පොහොර ඔවුනට ලැබීම, අනෙකුත් බෝගවලට සාපේක්ෂව දුම්කොළ වගාව සඳහා අවශ්‍ය ජල ප්‍රමාණය අඩුවීම, දුම්කොළ කර්මාන්තය දුම්කොළ වගා කිරීම සඳහා තාක්ෂණිකව සහාය දැක්වීම අනෙකුත් භෝග සඳහා රජයේ සහයෝගය අඩු වීම, දුම්කොළ කර්මාන්තය දුම්කොළ වගාකරුවන්ට මූල්‍යමය වශයෙන් ආධාර ලබා දීම වැනි විවිධ හේතු නිසාවෙනි.

මෙම ව්‍යාපෘතිය ජාතික වශයෙන් ක්‍රියාත්මක කිරීම ඵලදායී වේ. දුම්කොළ වෙනුවට විකල්ප භෝගයක් ලෙස ශක්තිමත් විභවයක් ඇති භෝග සඳහා සැපයුම් දාම ස්ථාපිත කිරීමට රජය සහාය විය යුතුය. දුම්කොළ වගාවට විකල්පයක් ලෙස භාවිතා කළ හැකි ආර්ථික වශයෙන් ශක්‍ය භෝග සොයා ගැනීම සඳහා තවත් පර්යේෂණ සිදු කළ යුතුය.

12.11 මොණරාගල හා අනුරාධපුර දිස්ත්‍රික්කවල දුම්කොළ වගාව වෙනුවට විකල්ප භෝග පිළිබඳව කෘෂිකර්ම නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප ඉහළ නැංවීමේ වැඩමුළුව

දුම්කොළ වගාව සඳහා විකල්ප භෝග හඳුන්වා දීමේ නියමු ව්‍යාපෘතිය 2021 දී සාර්ථකව නිම කරන ලදී. පළමු ඇගයීමේදී දුම්කොළ කර්මාන්තය දුම්කොළ ගොවීන්ට පොහොර, ණය සහ දුම්කොළ වගාව සඳහා උපදෙස් ලබා දීමෙන් අබණ්ඩව සහය වන බව සොයා ගන්නා ලදී. කෘෂිකර්ම නිලධාරීන්ගේ සහයෝගය නොමැතිව අපගේ ව්‍යාපෘතියේ තිරසාරභාවය අභියෝගාත්මක ය. එබැවින් ඉලක්කගත ප්‍රදේශවල කෘෂිකර්ම නිලධාරීන් සඳහා ධාරිතා ගොඩනැගීමේ වැඩමුළුවක් පැවැත්වීමට අනුකම්ටුව තීරණය කළේය. දුම්කොළ වගාව සඳහා විකල්ප භෝග පිළිබඳව කෘෂිකර්ම නිලධාරීන්ගේ දැනුවත්භාවය සහ කුසලතා වැඩි දියුණු කිරීම, ගොවීන්ගේ ජීවිත වැඩිදියුණු කිරීම සඳහා ශක්තිමත් සබඳතාවක් ගොඩනඟා ගැනීමට නිලධාරීන්ගේ කුසලතා සහ ආකල්ප වැඩිදියුණු කිරීම සහ මෙම කෘෂි නිලධාරීන් හරහා අධීක්ෂණ යාන්ත්‍රණයක් වර්ධනය කිරීම වැඩසටහනේ අරමුණු වේ.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකාර්මික පීඨයේ තාක්ෂණික සහාය ඇතිව මෙම වැඩසටහන් පවත්වන ලදී. මෙම වැඩමුළුව සඳහා අනුරාධපුර සහ මොණරාගල දිස්ත්‍රික්කවල කෘෂිකර්ම පර්යේෂණ නිලධාරීන් 60 දෙනෙකු සහභාගී විය. එය පැවැත්වුණේ 2022 අගෝස්තු 24 වැනිදාය.





ඡායාරූප 19 සහ 20: සම්පත් දායකයන් තම ඉදිරිපත් කිරීම් සිදු කරයි.



ඡායාරූපය 21: සහභාගිවූවන් සඳහා සහතිකපත් ප්‍රදානය

12.12 දුම්කොළ හා මද්‍යසාර නිවාරණය පිළිබඳ ජාතික සමුළුව- 2022

දුම්කොළ සහ මද්‍යසාර නිවාරණය පිළිබඳ ජාතික සමුළුව 2022 දෙසැම්බර් 2 වන දින වෝටර්ස් එජ් හෝටලයේ නෙළුම් ශාලාවේදී පවත්වන ලදී. කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යායතනයේ මහාචාර්ය කමල් පෙරේරා මහතා ප්‍රධාන කථිකයා ලෙස සහභාගි විය.

සෞඛ්‍ය අමාත්‍යාංශය, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, රුහුණු විශ්වවිද්‍යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සහ දුම්කොළ මර්දන මධ්‍යස්ථානය වැනි රාජ්‍ය නොවන සංවිධාන නියෝජනය කරමින් නියෝජිතයින් 50කට අධික පිරිසක් මෙම සමුළුව සඳහා සහභාගි වූහ. දුම්කොළ සහ මද්‍යසාර පරිභෝජනයේ ආර්ථික බලපෑම, දුම්කොළ සහ මද්‍යසාර පරිභෝජනයේ සෞඛ්‍ය බලපෑම, පාරිසරික තිරසාරභාවය සහ දුම්කොළ සහ මද්‍යසාර පාලනය, දුම්කොළ සහ මද්‍යසාර පාලනයේ නෛතික අංශ, දුම්කොළ සහ මද්‍යසාර පරිභෝජනයේ සමාජීය බලපෑම සහ දුම්කොළ සහ මද්‍යසාර නිවාරණය යන තේමාවන් හයක් යටතේ නිබන්ධන විසිඑකක් (21) සමුළුවට ඉදිරිපත් කරන ලදී.

වාචික ඉදිරිපත් කිරීම් සහ පෝස්ටර් ඉදිරිපත් කිරීම් ලෙස කාණ්ඩ දෙකක් යටතේ නිබන්ධන ඉදිරිපත් කරන ලදී. වියුක්ත ඉදිරිපත් කිරීම් ඇගයීමට ලක් කළ මණ්ඩල දෙකක් විය. සමුළුව සඳහා මඩුලු සාමාජිකයන් ලෙස පහත සාමාජිකයින් දායක විය.

- මහාචාර්ය සමාධි රාජපක්ෂ මහතා , සභාපති- දු.ම.ජා.අ
- බී.එම්.එස්. බණ්ඩාර මිය, අතිරේක ලේකම්, වෙළඳ අමාත්‍යාංශය
- හිරන්‍යා පෙරේරා මහත්මිය, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, අධිකරණ අමාත්‍යාංශය
- වෛද්‍ය ජානකී විදාන පතිරණ , අධ්‍යක්ෂ-ප්‍රතිපත්ති විශ්ලේෂණ සහ සංවර්ධන, සෞඛ්‍ය අමාත්‍යාංශය
- වෛද්‍ය රංග පෙරේරා, සම සෞඛ්‍ය විද්‍යා පීඨාධිපති, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය
- මහාචාර්ය කුසුමලතා ලංකාමුල්ල, කොළඹ විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සිංහල හා ජනසන්නිවේදන අංශ ප්‍රධානී
- වෛද්‍ය කෞමධි කරුණාගොඩ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, දේශීය වෛද්‍ය ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ, ආචාර්ය එච්.එම්.පී. හේරත් සහ සහ දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ රුවිනි වන්නිනායක මෙනවිය මෙම සම්මන්ත්‍රණයේ හොඳම වාචික ඉදිරිපත් කරන්නා සහ හොඳම පෝස්ටර් ඉදිරිපත් කරන්නා ලෙස පිළිවෙළින් සම්මාන ලැබීය.

















ඡායාරූප 22,23.24,25,26, 27, 28 සහ 29: අපේක්ෂකයන් වාචික ඉදිරිපත් කිරීම් සිදු කරය









ඡායාරූප 30, 31, 32 සහ 33: උත්සවයේ විශේෂ සිදුවීම්

12.13 දු.ම.ජා.අධිකාරියේ ආචාර ධර්ම සමාලෝචන කමිටුව ස්ථාපිත කිරීම

දු.ම.ජා. අධිකාරියේ ආචාර ධර්ම සමාලෝචන කමිටුව (ERC-NATA) 2021 අගභාගයේදී පිහිටුවන ලදී. එය 2022 සිට සක්‍රීයව ක්‍රියාත්මක විය. ආචාර ධර්ම සමාලෝචන කමිටුව වෛද්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව, සංඛ්‍යාලේඛන, නීතිමය අංශ වැනි විවිධ ක්ෂේත්‍රවල ප්‍රවීණයන් 24 දෙනෙකුගෙන් සමන්විත විය. එහි සාමාජික ලැයිස්තුව පහත දැක්වේ.

- සභාපති - රුවන් සත්කුමාර මහතා, අතිරේක ලේකම්, ජනමාධ්‍ය අමාත්‍යාංශය
- ලේකම් - විරාජ බණ්ඩාරනායක මහතා, නීති නිලධාරී, දු.ම.ජා. අ.
- දු.ම.ජා. අ. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික විජයානි රත්නායක මහත්මිය
- සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ වෛද්‍ය ජානකී විදානපතිරණ
- අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සභාපති ශාක්‍ය නානායක්කාර මහතා
- මහාචාර්ය දිලිප් ද සිල්වා, සභාපති මහාචාර්ය, දන්ත වෛද්‍ය පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- මහාචාර්ය කමල් පෙරේරා, දේශීය වෛද්‍ය ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය
- මහාචාර්ය නදීන ජයසූරිය, දන්ත වෛද්‍ය විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- මහාචාර්ය මනූරි සේනානායක, ළමා රෝග අංශය, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
- මහාචාර්ය චාන්දනී ලියනගේ, සමාජ විද්‍යාව පිළිබඳ මහාචාර්ය, කලා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ සහ රුහුණු විශ්වවිද්‍යාලයේ හිටපු මහාචාර්ය සී.එස්.වීරරත්න
- මහාචාර්ය කුසුමලතා ලංකාමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සිංහල හා ජනසන්නිවේදන අංශ ප්‍රධානී
- වෛද්‍ය ආර්. හනිෆා, කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පවුල් වෛද්‍ය අංශයේ ප්‍රධානී/දෙපාර්තමේන්තු
- වෛද්‍ය අමිල ඉසුරු, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨයේ මනෝ වෛද්‍ය අංශයේ ප්‍රධානී
- විශේෂඥ මනෝ වෛද්‍ය මේධානි හේවාගම
- වෛද්‍ය එන්. ජෙයකුමාරන්, උපදේශක සායනික පිළිකා විශේෂඥ, අපේක්ෂා රෝහල, මහරගම
- වෛද්‍ය බී කුමාරෙන්ද්‍රන්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වෛද්‍ය පීඨය, යාපනය විශ්වවිද්‍යාලය
- ආචාර්ය එස්.එම්. හෙට්ටිආරච්චි, ස්වසන රෝග පිළිබඳ ජාතික රෝහල, වැලිසර
- වෛද්‍ය රංග පෙරේරා, පිළිකා රෝග විශේෂඥ වෛද්‍ය/ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වෛද්‍ය පීඨය, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය
- වෛද්‍ය ශ්‍රීනිකා ද. සිල්වා වැලිඅංග, ප්‍රජා වෛද්‍ය/වෛද්‍ය සංඛ්‍යාලේඛන/ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ප්‍රජා වෛද්‍ය දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
- වෛද්‍ය නිශාන්ත කුමාරසිංහ, චර්යා විද්‍යා/වෛද්‍ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වෛද්‍ය පීඨය, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය
- රුහුණු විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ ඔසුසල් අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වෛද්‍ය සෙව්වන්දි සුබසිංහ
- ජාතික අධ්‍යාපන ආයතනයේ ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥ (විශ්‍රාමික) නදී අමා ජයසේකර මෙනවිය
- ව්‍යවසායක කමනි හෙට්ටිආරච්චි මෙනවිය

අධිකාරියේ ආචාර ධර්ම සමාලෝචන කමිටුවේ පළමු රැස්වීම 2022 ජනවාරි 11 වැනි දින සාර්ථකව පැවැත්විණි. මෙම රැස්වීමේ දී ගත් තීරණ අනුව, ERC-NATA හි මාර්ගෝපදේශ සකස් කර පොත් පිංචක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී (ISBN(978-955-0645-10-7).

පර්යේෂණ ව්‍යාපෘති සඳහා සදාචාරාත්මක සමාලෝචනයක් ලබා දීම සඳහා ERC-NATA පිළිගත් කමිටුවක් ලෙස පිළිගැනීමට සෞඛ්‍ය අමාත්‍යාංශය, ජාතික විද්‍යා පදනම සහ ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් ඉල්ලා සිටියේය. එහි ප්‍රතිඵලයක් ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශය ERC-NATA ආයතනය එවැනි කමිටුවක් ලෙස පිළිගෙන ඇත.

12.14 පාසල් පෙළ පොත් සඳහා දුම්කොළ හා මද්‍යසාර නිවාරණය ආශ්‍රිත සෞඛ්‍ය පණිවිඩ සකස් කිරීම

දුම්කොළ සහ මද්‍යසාර නිවාරණය සම්බන්ධ සෞඛ්‍ය පණිවිඩ සකස් කිරීම සඳහා විශේෂඥ කමිටුවක් පත් කිරීම මගින් මෙම වැඩසටහන 2021 වසරේ ආරම්භ කරන ලදී. සෞඛ්‍ය පණිවිඩ හැටක් (60) සකස් කරන ලද අතර ඒවා 2022 දී ප්‍රධාන භාෂා තුනට පරිවර්තනය කරන ලදී. එසේ සකස් කරන ලද සෞඛ්‍ය පණිවිඩ ඇතුලත් කර පොත් පිංචක් ISBN අංකය 978-624-5719-43-3 සහිතව ප්‍රකාශයට පත් කරන ලදී.

එම පණිවිඩ පාසල් පෙළපොත්වලට ඇතුළත් කිරීම සඳහා කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟ රැස්වීම් මාලාවක් පැවැත්විණි. එහි ප්‍රතිඵලයක් ලෙස සංවර්ධිත පණිවිඩ සංචිතයේ සෞඛ්‍ය පණිවිඩ කිහිපයක් 10 ශ්‍රේණියේ සිංහල මාධ්‍ය විද්‍යා පෙළපොතට සහ 11 ශ්‍රේණියේ දෙමළ මාධ්‍ය විද්‍යා පෙළපොතට ඇතුළත් කරනු ලැබීය.

12.15 අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කළ 20/2020 චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීම ඇගයීම

අධ්‍යාපන ආයතන පරිශ්‍ර දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන, මද්‍යසාර සහ වෙනත් මත්ද්‍රව්‍ය භාවිතයෙන්, ප්‍රවර්ධනයෙන් සහ වෙළඳාමෙන් තොර කලාපයක් බවට පත් කිරීම සම්බන්ධයෙන් 2020 ජූලි 29 වන දින අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අංක 20/2020 චක්‍රලේඛය නිකුත් කරන ලදී. දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (NATA) ද මෙම චක්‍රලේඛයේ ප්‍රධාන පාර්ශවකරුවෙකු ලෙස පිළිගෙන ඇත.

මේ අනුව, අධ්‍යාපන ආයතන විසින් මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීමේ මට්ටම තක්සේරු කිරීම සඳහා ඇගයීමක් පැවැත්වීමට අධිකාරය තීරණය කරන ලදී. ඇගයීම් ප්‍රශ්නාවලිය ගූගල් පෝරමයක් ලෙස සකස් කර එය ප්‍රධාන භාෂා තුනට පරිවර්තනය කරන ලදී. අධිකාරිය වෙනුවෙන් අධ්‍යාපන ආයතන අමතා ඇගයීම සිදු කිරීම සඳහා සංවර්ධිත ගූගල් පෝරම අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.

12.16 දුම්කොළ හා මද්‍යසාර නිවාරණය හා වැළක්වීම පිළිබඳ සහතිකපත්‍ර මනෝඋපදේශන පාඨමාලාව ඩිප්ලෝමා පාඨමාලාවක් දක්වා උත්ශ්‍රේණි කිරීම

මේ සම්බන්ධයෙන් ජාතික අධ්‍යාපන ආයතනයේ (NIE) අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟ සාකච්ඡා කරන ලද අතර දුම්කොළ සහ මද්‍යසාර නිවාරණය හා වැළක්වීම පිළිබඳ සහතිකපත්‍ර මනෝඋපදේශන පාඨමාලාව ඩිප්ලෝමා මට්ටම දක්වා උසස් කිරීම සඳහා වූ යෝජනාවක් ජා.අ.ආ. වෙත ඉදිරිපත් කරන ලදී.

12.17 ගෝලීය වැඩිහිටි දුම්කොළ සමීක්ෂණය -2020

ගෝලීය වැඩිහිටි දුම්කොළ සමීක්ෂණය 2020 වාර්තාව අධිකාරිය විසින් සම්පූර්ණ කරන ලද අතර ලෝක සෞඛ්‍ය සංවිධානය හරහා නිෂ්කාශනය සඳහා රෝග පාලන මධ්‍යස්ථානය (CDC) වෙත ඉදිරිපත් කරන ලදී.

12.18 දත්ත සිට ප්‍රතිපත්ති දක්වා මැයෙන් වූ වැඩමුළුව

Bloomberg Philanthropies" Data for Health Initiative හි සහය ඇතිව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් "දත්ත සිට ප්‍රතිපත්ති දක්වා" මැයෙන් වැඩමුළුවක් සංවිධානය කරන ලදී. ජාතික දුම්කොළ පාලන ප්‍රතිපත්තිය සකස් කිරීම මෙම වැඩමුළුවේ එක් අරමුණක් වූ බැවින් මෙම වැඩමුළුව සඳහා අධිකාරියේ නිලධාරීන් දෙදෙනෙකු සහභාගී කරවන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති විශ්ලේෂණ හා සංවර්ධන අධ්‍යක්ෂ ඉල්ලා සිටියේය.

වැඩමුළුව 2022 නොවැම්බර් 28 සිට 2022 දෙසැම්බර් 9 දක්වා කොළඹ 02 හිල්ටන් කලම්බු රෙසිඩන්සීස්හිදී පැවැත්විණි. අධිකාරිය නියෝජනය කරමින් අධිකාරියේ පර්යේෂණ නිලධාරීන් දෙදෙනෙක් (හංසමාලි වික්‍රමසූරිය මහත්මිය සහ බිමිසර මල්ෂාන් මහතා) සහභාගී වූහ.

12.19 දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ප්‍රජා දැනුවත් කිරීමේ වැඩසටහන යාවත්කාලීන කිරීම (එක් එක් දිස්ත්‍රික්කය සඳහා උග්‍ර අභ්‍යන්තර රෝගීන් සඳහා ඒකකය/පුනරුත්ථාපන මධ්‍යස්ථානය/සක්‍රීය මහජන හා යෝග්‍යතා ඒකකය)

මෙහි පළමු රැස්වීම 2022 ජූනි 17 වන දින සූම් තාක්ෂණය ඔස්සේ පවත්වන ලද අතර, අධ්‍යක්ෂ වෛද්‍ය රොහාන් රත්නායක (මානසික සෞඛ්‍ය අධ්‍යක්ෂ, සෞඛ්‍ය අමාත්‍යාංශය) මත්පැන් පුනරුත්ථාපන පහසුකම් පිළිබඳ තොරතුරු සපයන ලදී. මනෝවෛද්‍යවරුන්ගේ ආයතනයේ සාමාජිකයින්, මහාචාර්ය නාරද වර්ණසූරිය, (සෞඛ්‍ය අමාත්‍යාංශයේ දුම්කොළ, මද්‍යසාර සහ නීති විරෝධී ද්‍රව්‍ය පිළිබඳ විශේෂඥ කමිටුවේ සභාපති) සහ මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානයේ (ADIC) නියෝජිතයින් මෙම සාකච්ඡාව සඳහා සහභාගී වූහ.

12.20 මාධ්‍ය ක්‍රියාකාරකම්

අධිකාරියේ යූ ටියුබ් නාලිකාව, ගුවන්විදුලි මධ්‍යස්ථාන සහ රූපවාහිනී ජාල හරහා පහත සඳහන් මහජන දැනුවත් කිරීමේ ව්‍යාපාර සිදු කරන ලදී:

- 2022 ජනවාරි 5 වැනි දින V-FM හි අමාත්‍යාංශය මෙහෙයවන "කථා" ගුවන්විදුලි වැඩසටහන.
- 2022 ජනවාරි 6 වන දින ස්වර්ණවාහිනී නාලිකාවේ ආයුබෝවන් ශ්‍රී ලංකා රූපවාහිනී වැඩසටහන.
- 2022 ජනවාරි 8 වන දින ලක්හඬ, වෙඩිල්ල ගුවන්විදුලි වැඩසටහන
- දුම්කොළ වගාව සඳහා විකල්ප භෝග හඳුන්වාදීම සම්බන්ධයෙන් සභාපතිවරයා සහ අධිකාරියේ කාර්ය මණ්ඩලය විසින් අධිකාරියේ යූ ටියුබ් ඊ නාලිකාව හරහා මහජනතාව දැනුවත් කිරීමේ ව්‍යාපාර සිදු කරන ලදී - ජනවාරි 13,2022
- 2022 පෙබරවාරි 2 වන දින V-FM හි කථා අමාත්‍යාංශය මෙහෙයවන 'කථා' ගුවන්විදුලි වැඩසටහන.
- 2022 පෙබරවාරි 1 වන දින, ස්වර්ණවාහිනී නාලිකාවේ ආයුබෝවන් ශ්‍රී ලංකා රූපවාහිනී වැඩසටහන.
- 2022 පෙබරවාරි 15 වැනි දින V-FM ගුවන් විදුලි නාලිකාවේ අමාත්‍යාංශයේ ගුවන්විදුලි වැඩසටහන
- 2022 පෙබරවාරි 4 වන දින ලක්හඬ, වෙඩිල්ල ගුවන්විදුලි වැඩසටහන
- 2022 පෙබරවාරි 04 වැනි දින සියත රූපවාහිනියේ රූපවාහිනී වැඩසටහන
- 2022 ජනවාරි 8 වන දින ලක්හඬ, වෙඩිල්ල ගුවන්විදුලි වැඩසටහන
- දුම්කොළ සහ මද්‍යසාර අනිසි භාවිතය සම්බන්ධයෙන් දුරකථන උපදේශනය උපකාර වන ආකාරය සහ 1948-12 මාර්තු 2022 යන දිනයන්හිදී සභාපතිවරයා සහ අධිකාරියේ කාර්ය මණ්ඩලය විසින් අධිකාරියේ යූ ටියුබ් නාලිකාව හරහා මහජනතාව සඳහා දැනුවත් කිරීමේ ව්‍යාපාර සිදු කරන ලදී.
- 2022 අප්‍රේල් 01 වන දින ස්වර්ණවාහිනියේ ආයුබෝවන් ශ්‍රී ලංකා රූපවාහිනී වැඩසටහන.
- 2022 අප්‍රේල් 01 වන දින ශ්‍රී ලංකා ගුවන්විදුලිය, සුභාරතය ගුවන් විදුලි වැඩසටහන
- 2022 මැයි 31 වන දින ස්වර්ණවාහිනියේ ආයුබෝවන් ශ්‍රී ලංකා රූපවාහිනී වැඩසටහන.
- 2022 මැයි 27 වන දින ලක්හඬ, වෙඩිල්ල ගුවන්විදුලි වැඩසටහන.
- 2022 මැයි 28 වන දින රූපවාහිනියේ, ආයුබෝවන් රූපවාහිනී වැඩසටහන.
- 2022 මැයි 30 වැනි දින ITN රූපවාහිනී වැඩසටහන, 7 වැනි පැය
- ලෝක දුම්කොළ විරෝධී දිනය 2022- සභාපති පණිවිඩය - 2022 මැයි 31 සම්බන්ධයෙන් සභාපති සහ අධිකාරියේ කාර්ය මණ්ඩලය විසින් අධිකාරියේ යූ ටියුබ් නාලිකාව හරහා මහජනතාව දැනුවත් කිරීමේ ව්‍යාපාර සිදු කරන ලදී.
- උපාධි අපේක්ෂක සිසුන් සඳහා දුම්කොළ සහ මද්‍යසාර නිවාරණ විෂය මාලාව සම්බන්ධයෙන් සභාපති සහ අධිකාරියේ කාර්ය මණ්ඩලය විසින් එහි යූ ටියුබ් නාලිකාව හරහා මහජනතාව දැනුවත් කිරීමේ ව්‍යාපාර සිදු කරන ලදී - මැයි 15,2022
- 2022 ජූනි 03 වන දින ස්වර්ණවාහිනී නාලිකාවේ, ආයුබෝවන් ශ්‍රී ලංකා හි රූපවාහිනී වැඩසටහන.
- 2022 ජූනි 02 වන දින රූපවාහිනියේ, ආයුබෝවන් රූපවාහිනී වැඩසටහන
- 2022 ජූනි 04 වන දින සිරස ටීවී , සිතිජය රූපවාහිනී වැඩසටහන.

- 2022 ජූනි 06 වන දින ස්වර්ණවාහිනී නාලිකාවේ ආයුබෝවන් ශ්‍රී ලංකාවේ රූපවාහිනී වැඩසටහන.
- 2022 ජූනි 06 වැනි දින ලක්හඬ, වෙඩිල්ල ගුවන්විදුලි වැඩසටහන.
- 2022 ජූනි 10 වැනි දින සියත රූපවාහිනියේ රූපවාහිනී වැඩසටහන.
- 2022 ජූනි 13 වන දින සිරස, "ද පීපල්" රූපවාහිනී වැඩසටහන.
- 2022 ජූනි මස 14 වන දින, ස්වර්ණවාහිනී නාලිකාවේ ආයුබෝවන් ශ්‍රී ලංකාවේ රූපවාහිනී වැඩසටහන.
- 2022 ජූනි 24 වැනි දින V-FM හි "කථා" අමාත්‍යාංශයේ ගුවන්විදුලි වැඩසටහන
- 2022 ජූලි 21 වන දින ස්වර්ණවාහිනී නාලිකාවේ ආයුබෝවන් ශ්‍රී ලංකාවේ රූපවාහිනී වැඩසටහනට සහභාගී විය.
- 2022 ජූලි 22 වන දින ලක්හඬ, වෙඩිල්ල ගුවන්විදුලි වැඩසටහන.
- 2022 අගෝස්තු 22 වැනි දින මද්‍යසාර] සහ දුම්කොළවලින් මිනිස් සිරුරට සිදුවන අහිතකර බලපෑම් පිළිබඳව සභාපතිවරයා සහ අධිකාරියේ කාර්ය මණ්ඩලය විසින් එහි යූ ටියුබ් නාලිකාව හරහා මහජනතාව දැනුවත් කිරීමේ ව්‍යාපාර සිදු කරන ලදී.
- ශ්‍රී ලංකාවේ මුඛ පිළිකා සඳහා ප්‍රධාන හේතුව බුලත් විට සහ දුම්කොළ - මහාචාර්ය නදීන ජයසූරිය - ඔක්තෝබර් 5 සහ දුම්කොළ භාවිතයෙන් ඇති වන මුඛ පිළිකා පිළිබඳව සභාපතිවරයා සහ අධිකාරියේ කාර්ය මණ්ඩලය විසින් අධිකාරියේ යූ ටියුබ් නාලිකාව හරහා මහජනතාව දැනුවත් කිරීමේ ව්‍යාපාර සිදු කරන ලදී. - ඔක්තෝබර් 14.
- 2022 ඔක්තෝම්බර් 08 වන දින ලක්හඬ වෙඩිල්ල ගුවන්විදුලි වැඩසටහන
- 2022 ඔක්තෝබර් 10 වැනි දින V-FM 'කථා' අමාත්‍යාංශයේ ගුවන්විදුලි වැඩසටහන
- 2022 ඔක්තෝබර් 14 වැනි දින සියත රූපවාහිනියේ රූපවාහිනී වැඩසටහන
- 2022 නොවැම්බර් 1 වන දින VFM හි ගුවන්විදුලි වැඩසටහන
- 2022 නොවැම්බර් 04 වැනි දින ලක්හඬ වෙඩිල්ල ගුවන්විදුලි වැඩසටහන
- 2022 නොවැම්බර් 02 දින අක්ෂරය TV හි රූපවාහිනී වැඩසටහන
- 2022 නොවැම්බර් 01 වැනි දින V-FM, Katha අමාත්‍යාංශයේ ගුවන්විදුලි වැඩසටහන
- 2022 නොවැම්බර් 03 වැනි දින සියත රූපවාහිනියේ රූපවාහිනී වැඩසටහන.

අධිකාරියේ නිල ෆෙස්බුක් පිටුවට අනුගාමිකයින් 3727ක්, අධිකාරියේ යූ ටියුබ් නාලිකාවට ග්‍රාහකයින් 167ක් සහ අධිකාරියේ ඉන්ස්ටග්‍රම් පිටුවට අනුගාමිකයින් 26ක් ඇත. නිල ෆෙස්බුක් ප්‍රවේශයට අනුව, අධිකාරියේ ෆෙස්බුක් පිටුව 2022 දී මසකට 676,334 සිට 150,000 දක්වා පරිශීලකයින් වෙත ළඟා වී ඇත.

ඊට අමතරව දුම්කොළ සහ මද්‍යසාර ආශ්‍රිත ගැටළු අවම කිරීම සඳහා අධිකාරිය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව පුවත්පත් ලිපි 185 ක් පළ කරන ලදී.

12.21 චිත්‍රපටි සමාලෝචන වාර්තා සාරාංශය

2020 වසරේ සිට ශ්‍රී ලංකාවේ විකාශය වූ චිත්‍රපට අධිකාරිය විසින් ඇගයීමට ලක් කර නිර්දේශ කරනු ලබයි.

වගුව 4 චිත්‍රපට විචාර පිළිබඳ දළ විශ්ලේෂණයක්

භාෂාව	සමාලෝචනය කළ චිත්‍රපට
සිංහල	17
දෙමළ	03
ඉංග්‍රීසි	02
මුළු	22

12.22 මාධ්‍ය සම්මාන උත්සවය - 2022

ශ්‍රී ලංකාවේ දුම්කොළ සහ මද්‍යසාර නිවාරණය සඳහා ශ්‍රී ලංකාවේ ජනමාධ්‍යවේදීන්ගේ දායකත්වය අගය කිරීමේ අරමුණින් අධිකාරිය විසින් ඔවුන් වෙනුවෙන් උපදේශන වැඩසටහනක් සංවිධානය කරන ලදී. එම වැඩසටහන 2022 දෙසැම්බර් 02 වන දින සවස 6.00 සිට 8.00 දක්වා බත්තරමුල්ල ෝවෝටර්ස් එජ්ම හිදී පැවැත්විණි.

ඩිජිටල් මාධ්‍ය අංශයෙන් ඩිජිටල් මාධ්‍ය නාලිකා අටක් (සියත ටීවී, සිරස ටීවී, ටීවී දෙරණ, රූපවාහිනිය, ස්වර්ණවාහිනී, හිරු ටීවී, අයිටීඑන්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව) සඳහා සම්මාන ප්‍රදානය කරන ලද අතර සිරස රූපවාහිනී නාලිකාවේ "සිතිජය"වැඩසටහන වෙනුවෙන් විශේෂ සම්මානයක් පිරිනමන ලදී. මුද්‍රිත මාධ්‍ය අංශයෙන් මාධ්‍යවේදීන් තිදෙනෙකු (The Morning English පත්‍රයට වැනෙසා ඇන්තනි මහත්මිය, දිනමිණ පුවත්පත සඳහා ඉන්දික පොල්කොටුව මහතා සහ වීරකේසරි දෙමළ ඊ පුවත්පත සඳහා ආර්. රාම් කුමාර් මහතා) සම්මානයට පාත්‍ර විය. ගුවන්විදුලි නාලිකා තුනක් (ශ්‍රී.ල.ගු.වි.සංස්ථාව, වී එෆ් එම් සහ ලක්හඬ ගුවන්විදුලිය) ද පිදුම් ලැබූ අතර ඔවුන්ගේ ෙවඩිල්ල වැඩසටහනම වෙනුවෙන් ලක් එෆ් එම් වෙත විශේෂ සම්මානයක් ද පිරිනමන ලදී. විශේෂයෙන් දුම්කොළ සහ මද්‍යසාර පාලනයට සමාජ මාධ්‍ය ජාල දක්වන දායකත්වය සම්බන්ධයෙන් ද මෙම වසරේ ඇගයීමට ලක් විය. මෙලෙස දසත ලංකා ෆෙස්බුක් පිටුව මේ සම්බන්ධයෙන් ඇගයීමට ලක් විය. සෞඛ්‍ය අමාත්‍යාංශයේ උසස් නිලධාරීන්, ලෝක සෞඛ්‍ය සංවිධානයේ නියෝජිතයින් සහ අනෙකුත් පාර්ශවකරුවන් මෙම අවස්ථාවට සහභාගී වූහ.













ඡායාරූප 34,35,36,37,38 සහ 39 : සම්මාන උළෙලේ විශේෂ අවස්ථා

12.23 V NATA ජනමාධ්‍ය මගින් සිදුකරන උල්ලංඝනය කිරීම් පිළිබඳ ජංගම යෙදුම

දු.ම.ජා.අධිකාරිය විසින් "V NATA Media Violation App" නමින් ජංගම යෙදුමක් නිපදවා ඇත. සාමාන්‍ය ජනතාවට මෙම යෙදුම හරහා මාධ්‍ය මගින් පනත උල්ලංඝනය කිරීම් පිළිබඳව අධිකාරිය වෙත වාර්තා කළ හැකිය. මෙම ජංගම යෙදුම හඳුන්වාදීමේ මූලික අරමුණ වන්නේ ඩිජිටල් මාධ්‍ය භාවිතයෙන් දුම්කොළ සහ මද්‍යසාර නිෂ්පාදන පිළිබඳ අවිධිමත් ප්‍රචාරණය නැවැත්වීමයි.

මෙම ජංගම යෙදුම හරහා වාර්තා කරන ලද මාධ්‍ය උල්ලංඝනය කිරීම් පිළිබඳව අධිකාරිය විසින් තොරතුරු රැස් කර ඇති අතර, සියලුම සන්නිවේදන මාධ්‍ය හරහා නීති විරෝධී දුම්කොළ සහ මද්‍යසාර දැන්වීම් පිළිබඳ මහජන පැමිණිලි සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. V NATA මාධ්‍ය යෙදුම හරහා 2022 ජනවාරි සිට නොවැම්බර් දක්වා මහජන පැමිණිලි 200කට අධික ප්‍රමාණයක් ලැබී ඇත.

2022 දෙසැම්බර් 27 වැනි දින වන විට මහජනතාවගෙන් පැමිණිලි 199 ක් යෙදුම හරහා වාර්තා වී ඇත. මෙම පැමිණිලි 199 අතුරින්, 148 ක් සමාජ මාධ්‍ය සම්බන්ධ උල්ලංඝනය කිරීම ක් වූ අතර 09 ක් පුවත්පත්වලට අදාළ උල්ලංඝනය කිරීම් විය. රූපවාහිනී නාලිකා සිදු කළ උල්ලංඝනය කිරීම් 08 ක් ද, ප්‍රකාශයට පත්කළ ඡායාරූප මගින් උල්ලංඝනය වීම් 19 ක් ද වූ අතර තවත් 15 ක් දු.ම.ජා.අ. පනත උල්ලංඝනය කරමින් පළ කරන ලද අවිධිමත් දුම්කොළ සහ මද්‍යසාර දැන්වීම් විය.

ඉහත දත්තවලට අනුව වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ සමාජ මාධ්‍යවලට අදාළවය. ඒ අනුව වාර්තා වූ සියලුම පැමිණිලි සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. එසේම, පොලිස් දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව සහ අන්තරායකාර ඖෂධ පාලක ජාතික මණ්ඩලය ද නීතිමය ක්‍රියාවලියට සම්බන්ධ විය.

12.24 V NATA බලයලත් නිලධාරීන්ගේ ජංගම යෙදුම

අධිකාරිය පනතේ බලයලත් නිලධාරීන්ට (මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, සුරාබදු නිලධාරීන්, ආහාර සහ ඖෂධ පරීක්ෂකවරුන් සහ පොලිස් නිලධාරීන්) අධිකාරිය විසින් මෙම ජංගම යෙදුම හඳුන්වා දෙන ලදී. අධිකාරිය සහ බලයලත් නිලධාරීන් අතර සම්බන්ධතාවය ශක්තිමත් කිරීමේ අරමුණින් මෙම යෙදුම 2021 දී දියත් කරන ලදී.

2006 අංක 27 දරන දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත යටතේ බලයලත් නිලධාරීන් විසින් ගොනු කරනු ලබන නඩු කාලානුරූපව මෙම යෙදුම හරහා හඳුනා ගැනීම සහ ඇගයීම අධිකාරියේ අරමුණයි. ජංගම යෙදුම හරහා ලැබුණු තොරතුරු පිළිබඳ විස්තර පහත පරිදි වේ.

වගුව 5- VNATA යෙදුම සඳහා ලියාපදිංචි වී ඇතා මුළු නිලධාරීන් සංඛ්‍යාව

ලියාපදිංචි නිලධාරීන් වර්ගය	සංඛ්‍යාව
පොලිස් නිලධාරීන්	12
සුරාබදු නිලධාරීන්	10
මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු	188
ආහාර හා ඖෂධ පරීක්ෂකවරුන්	03
එකතුව	213

වගුව 6- එක් එක් කාණ්ඩයේ ලියාපදිංචි නිලධාරීන්ගෙන් ලැබුණු මුළු වාර්තා සංඛ්‍යාව

ලියාපදිංචි නිලධාරීන් වර්ගය	සංඛ්‍යාව
පොලිස් නිලධාරීන්	01
සුරාබදු නිලධාරීන්	01
මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු	30
ආහාර හා ඖෂධ පරීක්ෂකවරුන්	0
එකතුව	32

වගුව 7- දු.ම.ජා.අ. පනතේ එක් එක් වගන්තිය යටතේ ලැබුණු විමර්ශන වාර්තා

වගන්ති අංකය	ලැබුණු විමසීම් සංඛ්‍යාව
31 වගන්තිය	08
32 වගන්තිය	0
33 වගන්තිය	01
34 වගන්තිය	01
35 වගන්තිය	0
36 වගන්තිය	0
37 වගන්තිය	0
38 වගන්තිය	0
39 වගන්තිය	22
41 වගන්තිය	0
එකතුව	32

12.25 ජාත්‍යන්තර සම්මේලන

2022 පෙබරවාරි 3 වන දින පැවැති ලෝක සෞඛ්‍ය සංවිධානයේ පාර්ශවකරුවන්ගේ සම්මේලනයේදී (MOP) සහ පාර්ශවකරුවන්ගේ සාමාජික (MOP) රැස්වීම්වලදී, ලෝක සෞඛ්‍ය සංවිධානයේ මෙරට කේන්ද්‍රීය ආයතනය වන අධිකාරිය එහි සභාපතිවරයා මගින් ශ්‍රී ලංකාව නියෝජනය කළ 2022 නොවැම්බර් 21 සිට 25 දක්වා පැවැත්වූ COP9 සහ MOP2 රැස්වීම්වලදී තේරී පත් වූ කාර්යාංශයේ දෙවන ඒකාබද්ධ රැස්වීමට දායක විය..

12.26 මහජන සෞඛ්‍ය නිලධාරීන් සඳහා දුම්කොළවලින් තොර කලාප යළි සක්‍රිය කිරීමේ වැඩසටහන

පළාත් නවයම ආවරණය වන පරිදි බලයලත් නිලධාරීන් සඳහා පළාත් වැඩමුළු නවයක් පවත්වන ලදී. සෑම වැඩසටහනක්ම ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා ඇත. පළමු කොටස වූයේ දුම්කොළවලින් තොර කලාප ආරම්භ කිරීම සඳහා දැනුවත් කිරීම සහ පෙළඹවීම සහ දුම්කොළවලින් තොර කලාප සැලසුම් කිරීමයි. දෙවන කොටස වූයේ අධිකාරිය පනත බලාත්මක කිරීම වන අතර එය ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළේ අධිකාරිය පනත උල්ලංඝනය කිරීම්වලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ඉදිරියට ගෙන යන ආකාරය පිළිබඳ පුහුණුව සහ අලුතින් ආරම්භ කරන ලද වාර්තාකරණ පද්ධතිය පිළිබඳ පුහුණුව කෙරෙහිය. නීති සම්පාදන පුහුණුව සඳහා, දු.ම.ජා.අ. පනත උල්ලංඝනය කිරීම්වලට එරෙහිව නීතිගත කිරීමේ ක්‍රියා පටිපාටිය පුහුණු කිරීම සඳහා අධිකාරිය වැටලීම් සිදු කරන ලදී. සියලුම සහභාගිවන්නන් සඳහා බලයලත් නිලධාරීන් සඳහා (අධීක්ෂණ පද්ධතියක් ලෙස) අලුතින් සංවර්ධනය කරන ලද V-NATA ජංගම යෙදුමක් හඳුන්වා දෙන ලදී. මීට අමතරව, අධිකාරිය විසින් අනුරාධපුරය සහ මිහින්තලය දුම්කොළවලින් තොර කලාප ලෙස නම් කර ඇත. එය ප්‍රධාන වශයෙන් අනුරාධපුර පුදබිම් ආශ්‍රිතව පිහිටුවා තිබූ පොසොන් පොහොය උත්සවයට සැලකිය යුතු බලපෑමක් ඇති කළේය. දුම්කොළවලින් තොර කලාප ආරම්භ කිරීමේ ක්‍රියාවලිය සඳහා වැදගත් වූ තොරුතුරු, අධ්‍යාපනය හා සන්නිවේදනයට අදාළ ද්‍රව්‍ය උද්යෝගිමත් බලයලත් නිලධාරීන් අතර බෙදා දෙන ලදී. පහත පරිදි වැඩසටහන් පවත්වා ඇත.

වගුව 8: දුම්කොළවලින් තොර කලාය යළි සක්‍රිය කිරීමේ වැඩසටහන්වල විස්තර

දිනය සහ වේලාව	වැඩසටහන	සහභාගිවන්නන් සංඛ්‍යාව
2022 අප්‍රේල් 20	ම.සෞ.ප. සඳහා දුම්කොළවලින් තොර කලාප පිහිටුවීම පිළිබඳ වයඹ පළාත් දැනුම වැඩිදියුණු කිරීමේ සැසිය (පුහුණුව)	34
2022 අප්‍රේල් 20	ම.සෞ.ප. සඳහා දුම්කොළ මුක්ත කලාප පිහිටුවීම පිළිබඳ මධ්‍යම පළාත් දැනුම වැඩි දියුණු කිරීමේ සැසිය. (පුහුණුව)	33
2022 මැයි 3	ම.සෞ.ප. (පුහුණුව) සඳහා දුම්කොළ මුක්ත කලාප පිහිටුවීම පිළිබඳ උතුරු පළාත් දැනුම වැඩි දියුණු කිරීමේ සැසිය	39
2022 මැයි 4	දු.ම.ජා.අ. පනත බලාත්මක කිරීම පිළිබඳ පුහුණුව සහ VNATA යෙදුම් හඳුන්වාදීම - උතුරු පළාත	39
2022 මැයි 4	දු.ම.ජා.අ. පනත බලාත්මක කිරීම පිළිබඳ පුහුණුව සහ VNATA යෙදුම් හඳුන්වාදීම - උතුරු මැද පළාත	31
2022 මැයි 5	ම.සෞ.ප. සඳහා දුම්කොළවලින් තොර කලාප පිහිටුවීම පිළිබඳ උතුරු මැද පළාත් දැනුම වැඩි දියුණු කිරීමේ සැසිය (පුහුණුව)	39
2022 මැයි 17	ම.සෞ.ප. සඳහා දුම්කොළවලින් තොර කලාප පිහිටුවීම පිළිබඳ දකුණු පළාත් දැනුම වැඩි දියුණු කිරීමේ සැසිය (පුහුණුව)	45
2022 මැයි 18	දු.ම.ජා.අ. පනත බලාත්මක කිරීම පිළිබඳ පුහුණුව සහ VNATA යෙදුම් හඳුන්වාදීම (දැනුම වැඩි දියුණු කිරීමේ සැසිය ඉදිරියට.) - දකුණු පළාත	56
2022 මැයි 22	දු.ම.ජා.අ. පනත බලාත්මක කිරීම පිළිබඳ පුහුණුව සහ VNATA යෙදුම් හඳුන්වාදීම - නැගෙනහිර පළාත	61
2022 මැයි 23	ම.සෞ.ප. (පුහුණුව) සඳහා දුම්කොළවලින් තොර කලාප පිහිටුවීම පිළිබඳ නැගෙනහිර පළාතේ දැනුම වැඩි දියුණු කිරීමේ සැසිය	60
2022 මැයි 25	සබරගමුව පළාතේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් (පුහුණුව) සහ නීතිය බලාත්මක කිරීමේ සැසිය සඳහා දුම්කොළවලින් තොර කලාප පිහිටුවීම පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීමේ සැසිය	46
2022 මැයි 26	ඌව පළාතේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් (පුහුණුව) සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ සැසිය සඳහා දුම්කොළවලින් තොර කලාප පිහිටුවීම පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීමේ සැසිය	56
2022 මැයි 30	ම.සෞ.ප. සහ නීතිය බලාත්මක කිරීමේ සැසිය සඳහා දුම්කොළ මුක්ත කලාප පිහිටුවීම පිළිබඳ බස්නාහිර පළාත් දැනුම වැඩි දියුණු කිරීමේ සැසිය (පුහුණු)	59
2022 ජූනි 09	විශේෂයෙන් පුදබිම් අවට දුම්කොළවලින් තොර කලාප ආරම්භ කිරීම සඳහා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සියලුම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා තාක්ෂණික සැසිය	50
2022 ජූනි 10	අනුරාධපුර සහ මිහින්තලේ පුදබිමේ දුම්කොළ නිවාරණ කලාප ආරම්භ කිරීමේ සමාරම්භක උත්සවය	72



ඡායාරූපය 40: ම.සෞ.පරීක්ෂකවරුන් සඳහා කුරුණෑගල පැවැත්වූ වැඩසටහන







ඡායාරූප 41,42 සහ 43❑ ම.සෞ.පරීක්ෂකවරුන් සඳහා මාතර පැවැත්වූ වැඩසටහන

12.27 දුම්කොළවලින් තොර කලාප ස්ථාපිත කිරීම වෙනුවෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ දායකත්වය ඇගයීම

දුම්කොළවලින් තොර කලාප (TFZ) යලි සක්‍රිය කිරීම සඳහා ලෝ.සෞ.සංවිධානයේ අරමුදලින් ක්‍රියාත්මක ව්‍යාපෘතියක් අධිකාරිය දියත් කරන ලදී. ව්‍යාපෘතියේ මාස හයකට පසු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අධිකාරිය විසින් ඇගයීමට ලක් කරන ලද අතර, රට පුරා දුම්කොළ මුක්ත කලාප 230 කට ආසන්න සංඛ්‍යාවක් ස්ථාපිත කර ඇති බව පෙන්වා දෙන ලදී. පසුව අධිකාරිය විසින් දුම්කොළ මුක්ත කලාප නිර්මාණය කිරීමට සම්බන්ධ වූ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට උපහාර දැක්වීම සඳහා සමාලෝචන රැස්වීමක් සංවිධානය කරන ලදී. එපමණක් නොව, දුම්කොළින් තොර කලාප ආරම්භ කිරීම සම්බන්ධයෙන් පොතක් ප්‍රකාශයට පත් කිරීමට අධිකාරියට හැකි විය. මෙම උත්සවය 2022 දෙසැම්බර් 30 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ ජැස්මින් ශාලාවේදී පැවැත්විණි.









ඡායාරූප 44,45,46 සහ 47: උත්සවයේදී ම.සෞ. පරීක්ෂකවරුන්ට සම්මාන ප්‍රදානය කිරීම.

12.28 බස්නාහිර පළාතේ සෞඛ්‍ය වෘත්තිකයන්ට කරුණු දැක්වීම

දුම්කොළ සහ මද්‍යසාර නිවාරණයයේදී වෛද්‍ය වෘත්තිකයන් තීරණාත්මක කාර්යභාරයක් ඉටුකරයි. මෙම වැඩසටහනේ අරමුණ වූයේ සුදුසු දුම්කොළ බදු සූත්‍රයක් මෙන්ම දුම්කොළ සහ මද්‍යසාර නිවාරණය සහ නැවැත්වීමේ වැදගත්කම පිළිබඳව සෞඛ්‍ය වෘත්තිකයන්ගේ දැනුම ඉහළ නැංවීමයි. මෙම උත්සවය සැප්තැම්බර් 28 වැනි දින ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. මෙම වැඩසටහනට වෛද්‍යවරුන්, හෙද නිලධාරීන්, මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකයන් ඇතුළු සෞඛ්‍ය වෘත්තිකයන් 80 දෙනෙකුගේ සහභාගීත්වය ඇතුළත් වේ.







ජායාරූප 48,49 සහ 50: සෞඛ්‍ය වෘත්තිකයන් සඳහා වැඩසටහන

12.29 වෛද්‍ය උපාධි අපේක්ෂකයන් සඳහා දුම්කොළ හා මද්‍යසාර නිවාරණය පිළිබඳ විෂයමාලාව සංවර්ධනය

වෛද්‍ය උපාධි අපේක්ෂකයින් සඳහා දුම්කොළ සහ මද්‍යසාර නිවාරණය පිළිබඳ විෂයමාලා සංවර්ධනය සඳහා දු.ම.ජා.අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව 2021 දී අනු කමිටුවක් පත් කරන ලදී. දැනට පවතින වෛද්‍ය උපාධි පාඨමාලා තුළ දුම්කොළ, මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම පිළිබඳ පුහුණුව විධිමත් කිරීම සහ ශක්තිමත් කිරීම මෙම අනු කමිටුවේ ප්‍රධාන අරමුණ වේ.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව කමිටුව විසින් විෂය මාලාව සාර්ථකව සකස් කරන ලදී. ඒ අනුව සංවර්ධිත විෂය මාලාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අධිකාරිය 2022 පෙබරවාරි මාසයේදී යාපනය විශ්වවිද්‍යාලය සමඟ සාකච්ඡාවක් පැවැත්වීය. තවද, සංවර්ධිත විෂයමාලා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අධිකාරියට විශ්වවිද්‍යාල වලින් ධනාත්මක ප්‍රතිපෝෂණ ලැබුණු අතර අධිකාරිය විසින් සංවර්ධිත විෂයමාලා සඳහා අතථ්‍ය ඉගෙනුම් ද්වාරය / මාර්ගගත පාඨමාලාවක් සංවර්ධනය කිරීමට තීරණය කරන ලදී. එබැවින්, සංවර්ධිත විෂය මාලාව සඳහා අතථ්‍ය ඉගෙනුම් ද්වාරය / මාර්ගගත පාඨමාලා සංවර්ධනය කිරීමේ අරමුණින් සභාපති ඇතුළු සාමාජිකයින් හය දෙනෙකුගෙන් යුත් වෙනම කමිටුවක් පත් කිරීමට 2022 ජුනි මස පැවති 4 වන අනු කමිටු රැස්වීමේදී අනුකමිටුව තීරණය කළේය.

තවද, අතථ්‍ය ඉගෙනුම් ද්වාරය / මාර්ගගත පාඨමාලා සංවර්ධනය සම්බන්ධයෙන් අධිකාරිය විසින් 2022 සැප්තැම්බර් මාසයේදී දුම්කොළ මර්ධන මධ්‍යස්ථානය (CCT) සමඟ රැස්වීමක් පවත්වන ලදී. එහි පළමු රැස්වීමට අනුව, අධිකාරිය විසින් දුම්කොළ මර්ධන මධ්‍යස්ථානය සමඟ දෙවන රැස්වීම 2022 ඔක්තෝම්බර් මාසයේදී පවත්වන ලදී, අතථ්‍ය ඉගෙනුම් ද්වාරය / මාර්ගගත පාඨමාලා සංවර්ධනය සඳහා අයවැය ඇස්තමේන්තුව සාකච්ඡා කිරීමට.

එහි ප්‍රතිඵලයක් ලෙස, මෙම සංවර්ධිත විෂය මාලාව ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය පීඨ සමඟ එකාබද්ධ කිරීමට අධිකාරිය තීරණය කළේය. එබැවින්, අධිකාරිය විසින් 2022 නොවැම්බර් මස අගදී දේශීය වෛද්‍ය පීඨ හතරක් සමඟ රැස්වීමක් පැවැත්විය.

- දේශීය වෛද්‍ය ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය
- සිද්ධ වෛද්‍ය පීඨය, යාපනය විශ්වවිද්‍යාලය
- සිද්ධ වෛද්‍ය එකකය, නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
- ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය

රැස්වීමේ සාකච්ඡාවට අනුව දේශීය වෛද්‍ය පීඨවලින් සාමාජිකයින් සිව් දෙනෙකු අනු කමිටුවට පත් කිරීමට අධිකාරිය තීරණය කළේය.

12.30 මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පුවත්පත් කලාවේදීන් සඳහා උද්දේශන වැඩසටහන

දුම්කොළ සහ මද්‍යසාර භාවිතයෙන් තොර මාධ්‍ය වැඩසටහන් පැවැත්වීම පිළිබඳව ජනමාධ්‍ය අමාත්‍යාංශයට අනුබද්ධ මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය මාධ්‍යවේදීන් සඳහා උපදේශන වැඩසටහනක් අධිකාරිය විසින් පවත්වන ලදී. මෙම වැඩසටහන 2022 දෙසැම්බර් 15 වන දින මාතර, නුපේ, සහන වෛද්‍ය ආයතනයේදී පැවැත්විණි. අධිකාරිය විසින් ආරම්භ කරන ලද අමාත්‍යාංශ පුහුණු වැඩසටහන් වල කොටසක් ලෙස මෙය සිදු කරන ලද අතර මාතර දිසාපති නීතීඥ වයි. වික්‍රමසිරි මහතා සහ අධිකාරියේ සභාපති මහාචාර්ය සමාධි රාජපක්ෂ මහතා මෙම අවස්ථාවට සහභාගි විය.





ඡායාරූප 51 සහ 52: වැඩසටහනේ විශේෂ අවස්ථා

12.31 විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සඳහා දුම්කොළ හා මද්‍යසාර නිවාරණ ධාරිතා ගොඩ නැංවීමේ පුහුණුව (ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය)

2022 නොවැම්බර් 8 වන දින, දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සමඟ එක්ව, සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ සිසුන් සඳහා දැනුම වැඩි දියුණු කිරීමේ වැඩසටහනක් කොතලාවල ආරක්ෂක විදුහල් රෝහල් ශ්‍රව්‍යාගාරයේදී පවත්වන ලදී. අධිකාරියේ සභාපති මහාචාර්ය සමාධි රාජපක්ෂ, විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති වෛද්‍ය රංග පෙරේරා යන මහත්වරු මෙම අවස්ථාවට සහභාගි වූහ.







ඡායාරූප 53,54 සහ 55: විශ්වවිද්‍යාල සිසුන් සඳහා වැඩසටහන

12.32 විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සඳහා දුම්කොළ හා මද්‍යසාර නිවාරණ ධාරිතා ගොඩ නැංවීමේ පුහුණුව (දේශීය වෛද්‍ය ආයතනය)

කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය ආයතනය , රට තුළ මත්පැන් සහ දුම්කොළ පාලනයට බලපාන නීති පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සඳහා 2022 නොවැම්බර් 3 වැනි දින සැසියක් පැවැත්වීය. දේශීය වෛද්‍ය ආයතනය නියෝජනය කරමින් මහාචාර්ය කමල් පෙරේරා සහභාගී වූ අතර, අධිකාරියේ සභාපති මහාචාර්ය සමාධි රාජපක්ෂ විසින් පුහුණු වැඩසටහන මෙහෙයවන ලදී.







ඡායාරූප 56,57 සහ 58 : විශ්වවිද්‍යාල සිසුන් සඳහා දුම්කොළ හා මද්‍යසාර නිවාරණය පිළිබඳ ධාරිතා ගොඩනැංවීමේ පුහුණුව (දේශීය වෛද්‍ය ආයතනය)

12.33 ග්‍රාම නිලධාරීන් සවිබල ගැන්වීම හරහා මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බීම් මට්ටමේ දුම්කොළ හා මද්‍යසාර නිවාරණ ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම

අධිකාරිය විසින් 2022 දෙසැම්බර් 12 වන දින මාතර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ ග්‍රාම නිලධාරීන් සඳහා දුම්කොළ සහ මද්‍යසාර නිවාරණය සඳහා ප්‍රජා සහභාගීත්වය ඉහළ නැංවීම පිළිබඳ පුහුණුවක් අමාත්‍යාංශ පුහුණු වැඩසටහනේ කොටසක් ලෙස මාතර නුපේ, සහන වෛද්‍ය ආයතනයේදී පවත්වන ලදී. මෙම වැඩසටහන සඳහා මාතර ප්‍රාදේශීය ලේකම් කෞෂල්‍යා කුමාරි මහත්මිය සහ අධිකාරියේ සභාපති මහාචාර්ය සමාධි රාජපක්ෂ මහතා ඇතුළු පිරිසක් සහභාගි වූහ.





ජායාරූප 59 සහ 60: මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීන් සඳහා පැවැත්වූ වැඩසටහන

12.34 ජා.දු.ම.අ. පනත ක්‍රියාත්මක කිරීම පිළිබඳව බලයලත් නිලධාරීන් පුහුණු කිරීම

දු.ම.ජා.අ.පනත ක්‍රියාත්මක කිරීම පිළිබඳ විශේෂඥ දැනුම සඳහා බලයලත් නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන 2022 සැප්තැම්බර් 11 වැනි දින බත්තරමුල්ල වෝටර්ස් එජ් හෝටලයේදී පැවැත්විණි. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් පනස් දෙනෙකු, පොලිස් නිලධාරීන් 20 දෙනෙකු, සුරාබදු නිලධාරීන් 20 දෙනෙකු සහ ආහාර හා ඖෂධ පරීක්ෂකවරුන් 5 දෙනෙකු මෙම අවස්ථාවට සහභාගී වූහ. ගරු. මහේස්ත්‍රාත් මංජුල කරුණාරත්න මහතා අධිකාරියේ සභාපති මහාචාර්ය සමාධි රාජපක්ෂ මහතා සමග මෙම උත්සවයට සහභාගි විය. මෙම වැඩසටහන සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානය අරමුදල් සපයන ලදී.

12.35 ජාතික ප්‍රවාහන කොමිෂන් සභාවේ සහයෝගිතාවයෙන් බස් රථ රියදුරන් හා කොන්දොස්තරවරුන් සඳහා වැඩමුළුව

අධිකාරිය විසින් 2022 මාර්තු සිට සැප්තැම්බර් දක්වා අන්තර් පළාත් කොන්දොස්තරවරුන් සහ රියදුරන් 700ක් පමණ ජාතික ගමනාගමන කොමිෂන් සභාවේදී දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. දුම්කොළ සහ මද්‍යසාර නිෂ්පාදන නිවාරණය පිළිබඳව දැනුවත් කිරීම මෙම වැඩසටහනේ මූලික අරමුණ විය. ඊට අමතරව දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ අන්තර් පළාත් ප්‍රවාහන සේවකයින්ගේ දැනුම, ආකල්ප සහ භාවිතයන් හඳුනාගැනීම සඳහා අධිකාරිය සමීක්ෂණ පවත්වා ඇත.

දුම්කොළ සහ මද්‍යසාර නැවැත්වීම සහ නිවාරණය පිළිබඳ 1948 හදිසි ඇමතුම් සේවාව සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සහාය ඇතිව අන්තර් පළාත් පෞද්ගලික බස් රථවල අධිකාරියෙහි 1948 දුරකථන මනෝ උපදේශන සේවාවේ කෙටි කේතය සහිත ස්ටිකර් ප්‍රදර්ශනය කිරීමට 2022 සැප්තැම්බර් 13 දින අධිකාරිය කටයුතු කරන ලදී.





ජායාරූප 61 සහ 62: බස්රථවල 1948 දුම්කොළ හා මද්‍යසාරවලින් සේවාව පිළිබඳ ස්ටිකර් ඇලවීම





ඡායාරූප 63 සහ 64: බස් රථ රියදුරන් සහ කොන්දොස්තරවරුන් සඳහා ජාතික ප්‍රවාහන කොමිෂන් සභාවේ පැවැත්වූ වැඩසටහන

12.36 දුම්කොළ හා මද්‍යසාර නිවාරය හා නිවාරණය පිළිබඳ වැඩමුළුව - බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා අධිකාරිය විසින් දුම්කොළ සහ මද්‍යසාර නැවැත්වීම සහ වැළැක්වීම පිළිබඳ වැඩමුළුව පවත්වන ලදී. මෙම වැඩමුළුව සඳහා 25 දෙනෙකු පමණ සහභාගී වී සිටියහ. බිමල් රාජකරුණා මහතා (ජ්‍යෙෂ්ඨ කළමනාකාර, සණස සංවර්ධන බැංකුව) සහ විරාජ බණ්ඩාරනායක මහතා (අධිකාරියේ නීති නිලධාරී, නීතිඥ) මෙම වැඩසටහන සඳහා සම්පත් දායකයින් ලෙස සිය දායකත්වය ලබා දෙන ලදී.





ඡායාරූප 65 සහ 66: බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතිය කටයුතු අමාත්‍යාංශයේ ක්ෂෙත්‍ර නිලධාරීන් සඳහා දුම්කොළ හා මද්‍යසාර නිවාරණ වැඩසටහන

13 මූල්‍ය ප්‍රගතිය (2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා)

දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය
2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව

	සටහන	2022	2021
වත්කම්			
ජංගම නොවන වත්කම්			
යටිතල පහසුකම්, පිරියත සහ උපකරණ	16	9,610,137.66	11.901780.33
අස්පෘශ්‍ය වත්කම්	18	8,069,635.10	8,567,995.49
ජංගම වත්කම්			
තොග	19	65,894.14	46.638.92
ලැබිය යුතු දෑ	26	-	-
පූර්ව ගෙවීම්	28	125,000.00	50,000.00
මුදල් හා මුදලට සමාන දෑ	20	1,820,811.92	1,198.,009.00
මුළු වත්කම්		**19,691,478.82**	**21,764,423.74**
බැරකම්			
ජංගම බැරකම්			
උපචිත වියදම්	21	574,899.05	500,892.01
විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන	22	3,708,000.00	4,368,000.00
ගෙවිය යුතු දෑ	34	125.00	-
ජංගම නොවන බැරකම්			
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	22	946,400.00	687,157.50
මුළු බැරකම්		**5,229,424.05**	**5,556,049.51**
මුළු ශුද්ධ වත්කම්		**14,462,054.77**	**16,208,374.23**
ශුද්ධ වත්කම්/ස්කන්ධ			
ප්‍රාග්ධනය	24	6,560,893.26	6,560,893.26
රජයේ ප්‍රදානය- ප්‍රාග්ධනය	25	16,416,564.15	19,206,567.21
සමුච්චිත අතිරික්ත/ (හිඟය)	29	(9,001,971.81)	(9,961,479.56)
පෙර වසරේ ගැලපීම්	27	-	-
ප්‍රාග්ධන ලාභ	33	486,569.17	402,393.32
		14,462,054.77	**16,208,374.23**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත්කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ ඔවුන් වෙනුවෙන් අත්සන් කරනු ලැබ ඇත.

.....	.....	.....
වෛද්‍ය ඇලන් ලුඩොවික්	අධ්‍යක්ෂ	අධ්‍යක්ෂ
සභාපති		

.....
අනුෂිකා කෝරළගේ
ගණකාධිකාරී

දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා
මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	2022	2021
		රු.	රු.
මෙහෙයුම් ආදායම			
රජයේ ප්‍රදානය - පුනරාවර්තන	9	30,390,000.00	22,883,000.00
ආදායම - ප්‍රාග්ධන ප්‍රතිපූරණය	31	9,027,325.20	8,218,725.00
අනෙකුත් ආදායම (සැපයුම්කරුවන් ලියාපදිංචිකිරීමෙන් ලැබුණු ආපසු නොගෙවනු ලබන මුදල්)	23	39,875.00	-
ප්‍රාග්ධන ප්‍රදානය ක්‍රමක්ෂය	30	2,825,753.06	2,583,951.20
මුළු ආදායම		**42,282,953.26**	**33,685,676.20**
මෙහෙයුම් වියදම්			
සේවක වැටුප්	10	16,301,086.24	13,478,536.51
සැපයුම් හා භාවිතා කළ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය	11	605,033.33	423,987.49
නඩත්තුව	12	478,375.64	506,886.06
ගිවිසුම්කර සේවා	13	11,860,031.43	11,056,849.53
ක්ෂයවීම් හා ක්‍රමක්ෂය	14	2,825,753.06	2,583,951.19
වැඩසටහන් සඳහා වියදම	32	9,162,479.96	7,152,584.64
මුළු මෙහෙයුම් වියදම්		**41,232,759.66**	**35,202,795.42**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් අතිරික්තය/(හිඟය)		**1,050,193.60**	**(1,517,119.22)**
මූල්‍ය පිරිවැය			
බැංකු ගාස්තු	15	6,510.00	6,300.00
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ අතිරික්තය/ (හිඟය)		**1,043,683.60**	**(1,523,419.22)**

දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	සටහන	2021	2020	
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ		රු.	රු	
			ප්‍රකාශිත	නැවත ප්‍රකාශිත
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් අතිරික්තය/(හිඟය)		1,043,683.60	(1,523,419.22)	(1,523,419.22)
ගැලපීම්::				
උපචිත වියදම් ගැලපීම		-	(2,960,000.00)	(2,960,000.00)
ක්ෂය කිරීම් ගැලපුම	29	-	1,155,241.16	1,155,241.16
			-	(540,000.00)
කාරක ප්‍රාග්ධන ගාස්තුවලට පෙර මෙහෙයුම් ලාභය		**(1,043,683.60)**	**(3,328,178.06)**	**(5,023,419.22)**
ක්ෂයවීමේ වැඩිවීම/ (අඩුවීම)	14	2,825,753.06	2,583,951.19	2,583,951.19
රජයේ ප්‍රාග්ධන ප්‍රදානය ක්‍රමක්ෂය	30	(2,825,753.06)	(2,583,951.19)	(2,583,951.19)
තොග (වැඩිවීම)/අඩුවීම	19	(19,255.22)	(14,944.91)	(14,944.91)
ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම	26	-	-	-
පූර්ව ගෙවීම් (වැඩිවීම)/අඩුවීම	28	(75,000.00)	-	-
ගෙවිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම	34	125.00	-	-
උපචිතවීම් (වැඩිවීම)/අඩුවීම	21	74,007.04	229,307.82	229,307.82
සේවක පිරිවැටය අදාළ ප්‍රතිපාදනවල (වැඩිවීම)/අඩුවීම	22	(400,757.50)	853,952.50	277,992.50
මෙහෙයුම්වලින් උත්පාදිත මුදල්		**622,802.92**	**(2,259,,822.65)**	**(4,531,063.81)**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ		**622,802.92**	**(2,259,,822.65**	**(4,531,063.81)**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ				
පිරියත හා උපකරණ අත්කර ගැනුම	16.1	(35,750.00)	(103,960.00)	(103,960.00)
අස්පෘශ්‍ය වත්කම් අත්කර ගැනුම	18.1	-	(4,314,980.00)	(4,314,980.00)
ඉවත් කළ හැකි ස්ථාවර වත්කම් ලාභ/(අලාභ)	33	-	(84,175.85)	18,300.00
ප්‍රාග්ධන ප්‍රතිපූරණය (රජයේ ප්‍රදානය)	25	332,618.02	332,618.02	4,418,940.00
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ		-	**(1,977,825.85)**	18,300.00
මුදල් හා මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම/(අඩුවීම)		622,802.92	(4,237,648.50)	(4,502,763.81)
වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ		1,192,609.34	1,712,497.48	1,987,612.80
වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ (විදේශ අරමුදල්)	20	5,399.66	3,723,160.02	3,723,160.02
වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ		**1,820,811.92**	**1,198,009.00**	**1,198,009.00**

දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය
2022 දෙසැම්බර් 31 දිනට
ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය

	2022
	රු.
2022.01.01 දිනට දු.ම.ජා.අ. අරමුදල	**16,208,374.23**
පෙර වර්ෂවලට අදාළ ගැලපීම්	-
පෙර වර්ෂ සඳහා ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය	-
2022.01.01 දිනට ගැලපූ ශේෂය	**16,208,374.23**
ප්‍රාග්ධන ප්‍රතිපූරණය	35,750.00
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය	(2,825,753.06)
ප්‍රාග්ධන ලාභ	-
කාලසීමාව සඳහා ගැලපීම	-
වර්ෂය සඳහා අතිරික්තය/ (හිඟය)	1,043,683.60
2022.12.31 දිනට ශේෂය	**14,462,054.77**

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2022 දෙසැම්බර් 31න් අවසන් වසර

1. පිළියෙල කිරීමේ පදනම

1.1 අනුකූලතා ප්‍රකාශනය

දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වලින් සමන්විත වේ. මෙම ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිවරුන්ගේ ආයතනය (ශ්‍රී.ල.ව.ග.අ.) විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව පිළියෙල කර ඇත.

1.2 කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය මත පිළියෙල කර ඇති අතර ශ්‍රී ලංකා රුපියල්වලින් (රු.) ඉදිරිපත්කර ඇත.

1.3 රජයේ ප්‍රදාන

මණ්ඩලය දෙවර්ගයක රජයේ ප්‍රදාන ලබයි, එනම්-

- ප්‍රාග්ධන ප්‍රදාන
- පුනරාවර්තන ප්‍රදාන

ප්‍රාග්ධන ප්‍රදාන රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අනුව ගිණුම් ගත කොට ඇත. එම ක්‍රමයේදී ප්‍රාග්ධන ප්‍රදාන විලම්භිත ආදායමක් සේ සලකා ඇති අතර එය මූලිකවම වත්කම්වල ප්‍රයෝජ්‍ය ආයුකාලය මත පිළිගෙන ඇත. (උදා: වත්කම්වල වාර්ෂිකව ක්ෂයවන වටිනාකම වර්ෂය සඳහා ආදායමක් ලෙස ගිණුම්ගත කර ඇත.) පුනරාවර්තන ප්‍රදානය අදාළ කාල සීමාවේ ආදායම ලෙස පිළිගෙන ඇති අතර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට බැර කර තිබේ.

2. වත්කම් සහ ඒවායේ තක්සේරු පදනම්

2.1 දේපළ, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණවල පිරිවැය, වත්කම් ඒවායේ අපේක්ෂිත භාවිතය සඳහා වැඩකරන තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද යම් වියදම් සමගින් අත්කර ගැනුමේ හෝ ඉදිකිරීමේ පිරිවැය වේ.

වත්කම් භාවිතයට ගත හැකි දිනයේ සිට අපහරණය කරන දිනය දක්වා ක්ෂයවීම් සපයා ඇත. පිරියත හා උපකරණ පහත දැක්වෙන පරිදි සරල රේඛීය ක්‍රමය මත ක්ෂය කරනු ලැබේ. තවද, දේපළ, පිරියත හා උපකරණ ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර. 7 - දේපළ, පිරියත හා උපකරණ හි නිර්දේශ කර ඇති පරිදි පිරියත හා උපකරණ පිරිවැය ක්‍රමවේදයට ගිණුම් ගත කොට ඇත.

ප්‍රධාන වාර්ෂික අනුපාත පහත පරිදි භාවිතා කරනු ලැබේ.

ගොඩනැගිලි හා සවිකිරීම්	වසර 25 (4%)
යන්ත්‍රෝපකරණ හා උපකරණ	වසර 10 (10%)
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	වසර 10 (10%)
පරිගණක	වසර 5 (20%)

වෙනත් වසර 10 (10%)

වත්කමක ක්ෂයවීම් අනුපාතයේ, ශේෂ වටිනාකමේ ප්‍රයොජ්‍ය ආයු කාලයේ සැලකිය යුතු වෙනසක් සිදුව තිබෙන බව පෙන්නුම් කරන්නේ නම්, එම වත්කමේ ක්ෂයවීම, නව අපේක්ෂණය පිළිබිඹු කිරීම පිණිස අනාගතය ගැන සැලකිල්ලට ගනිමින් ප්‍රතිශෝධනය කරනු ලැබේ.

මුලින් තක්සේරු කරන ලද කාර්යසාධන ප්‍රමිතියෙන් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ පවත්වා ගැනීම පිණිස දේපළ, පිරියත හෝ උපකරණ අළුත්වැඩියාව හෝ නඩත්තුව පිණිස දරන ලද වියදම්, එසේ දැරූ විටදී වියදමක් ලෙස පිළිගනු ලැබේ.

2.2. අස්පෘශ්‍ය වත්කම්

මෘදුකාංග මිලදී ගැනීම සඳහා දරන ලද වියදම් අස්පෘශ්‍ය වත්කමක් සේ පිළිගනු ලබන අතර එම වත්කම් ඒවායේ ප්‍රයෝජ්‍යවත් ආයු කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ. ප්‍රධාන වාර්ෂික අනුපාත පහත දැක්වෙන පරිදි වේ.

අස්පෘශ්‍ය වත්කම් වසර 20 (5%)

3. වට්ටෝරු භාණ්ඩ

වට්ටෝරු භාණ්ඩ පිරිවැයට තක්සේරු කොට ඇත.

4. මුදල් හා මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ අතැති මුදල් හා බැංකුවේ ඇති මුදල්වලින් සමන්විත වේ.

5. බැරකම්

අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස වත්මන් බැඳීමක් තිබෙන විටදී ශේෂ පත්‍රයේ බැරකම් පිළිගනු ලැබේ. ණය හිමියකුගේ ඉල්ලීම මත ගෙවිය යුතු හෝ ශේෂ පත්‍රයේ දිනයේ සිට වසරක් තුළ ගෙවිය යුතු බැඳීම්, ශේෂ පත්‍රයේ වත්මන් බැරකම් ලෙස සලකනු ලැබේ.

6. ආදායම හඳුනාගැනීම

ප්‍රාග්ධන ප්‍රදානය විලම්භිත ආදායමක් ලෙස පිළිගෙන තිබේ. පුනරාවර්තන වියදම කාලසීමාව තුළ ආදායමක් ලෙස හඳුනාගෙන ඇති අතර ආදායම් ප්‍රකාශනයට බැර කරනු ලැබේ. සියලු වියදම් උපචිත පදනමින් හඳුනාගෙන ඇත.

7. දායකත්ව සැලසුම්

මණ්ඩලය සේවකයන්ගේ දළ වැටුපෙන් අනුපිළිවෙලින් 12% ක් සහ 3%ක් අර්ථසාධක අරමුදල සහ භාරකාර අරමුදල වෙනුවෙන් දායක කරයි.

8. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

වක්‍ර ක්‍රමවේදය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර තිබේ.

දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය
2022.12.31 න් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

සටහන: 9	2022	2021
පුනරාවර්තන ප්‍රතිපූරණය	රු.	රු.
පුනරාවර්තන ප්‍රතිපූරණය (9.1)	30,390,000.00	22,883,000.00
එකතුව	30,390,000.00	**22,883,000.00**

සටහන: 10	2022	2021
සේවක පඩිනඩි	රු.	රු.
කාර්ය මණ්ඩල වැටුප්	14,282,987.90	11,594,640.25
සේ.අ.අ. දායක මුදල්	1,337,257.72	1,173,602.14
සේ,හා.අ. දායක මුදල්	334,314.42	293,400.54
අතිකාල	82,843.70	198,321.69
පාරිතෝෂික වියදම්	259,242.50	193,992.50
නව බදවාගැනීම් සඳහා වියදම	4,440.00	24,575.00
උත්සව ණය මත සිදුවූ වියදම	-	4.39
එකතුව	**16,301,086.24**	**8**,306,567.51

සටහන: 11	2022	2021
සැපයුම් සහ පරිභෝජ්‍ය ද්‍රව්‍ය	රු.	රු.
ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	103,147.22	159,748.49
ඉන්ධන	393,314.00	215,668.00
ආහාර/ සැහැල්ලු ආහාර පාන	108,572.11	48,571.00.
එකතුව	**605,033.33**	**423,987.49**

සටහන: 12	2022	2021
නඩත්තුව	රු.	රු.
වාහන නඩත්තුව	241,462.02	331,363.97
කාර්යාල උපකරණ නඩත්තුව (පරිගණක හා යන්ත්‍රෝපකරණ)	236,913.62	175,522.09
එකතුව	**478,375.64**	**506,886.06**

සටහන: 13	2022	2021
ගිවිසුම්කර සේවා	රු.	රු.
තැපැල් ගාස්තු	31,465.00	14,885.00
දුරකථන/අන්තර්ජාල ගාස්තු	174,342.79	154,553.66
ගොඩනැගිලි කුලිය/පිරිසිදු කිරීමේ සේවා	8,965,470.35	8,611,188.03
විදුලි ගාස්තු	717,573.29	602,320.84
පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩල ගාස්තු සහ සංග්‍රහ	955,044.00	848,913.00
වෙළඳ ප්‍රචාරණ/ අනෙකුත් වියදම්	82,301.00	164,989.00
විගණන ගාස්තු	660,000.00	660,000.00
කාර්යක්ෂමතා කඩඉම් විභාග ගාස්තු	273,835.00	-
එකතුව	**11,860,031.43**	**11,056,849.53**

සටහන: **14**	**2022**	**2021**
ක්ෂයවීම - දේපළ, පිරියත හා උපකරණ	රු.	රු.
ගොඩනැගිලි සහ සවිකිරීම්	99,290.00	99,290.00
යන්ත්‍රෝපකරණ හා උපකරණ	158,666.16	158,288.22
ගෘහ භාණ්ඩ හා සවිකුරු	183,714.75	180,960.95
පරිගණක	442,567.83	399,897.72
වාහන	1,414,350.00	1,414,350.00
ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ	-	-
වෙනත්	28,803.93	28,428.38
ක්ෂයවීම- අස්පෘශ්‍ය වත්කම්		
අස්පෘශ්‍ය වත්කම්	498,360.39	302,735.92
එකතුව	**2,825,753.06**	**2,583,951.19**

සටහන: **15**	**2022**	**2021**
මූල්‍ය පිරිවැය	රු.	රු.
බැංකු ගාස්තු	6,510.00	6,300.00
එකතුව	**6,510.00**	**6,300.00**

සටහන: **16**	**2022**	**2021**
පිරියත හා උපකරණ (16.1)	රු.	රු.
ගොඩනැගිලි සහ සවිකිරීම්	1,934,782.34	2,004,422.34
යන්ත්‍රෝපකරණ හා උපකරණ	621,249.72	779,915.88
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	783,221.05	966,935.80
පරිගණක	1,171,067.78	1,608,685.61
වාහන	4,922,208.08	6,336,558.08
වෙනත්	177,608.08	205,262.61
එකතුව	**9,610,137.66**	**11,901,780.33**

සටහන: **18**	**2022**	**2021**
අස්පෘශ්‍ය වත්කම්	රු.	රු.
අස්පෘශ්‍ය වත්කම් (18.1)	8,069,635.10	8,567,995.49
එකතුව	**8,069,635.10**	**8,567,995.49**

සටහන: **19**	**2022**	**2021**
වට්ටෝරු භාණ්ඩ (19.1	රු.	රු.
ලිපිද්‍රව්‍ය	65,894.14	46,638.92
කාර්යාල උපකරණ නඩත්තුව	-	-
එකතුව	**65,894.14**	**46,638.92**

දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය
2021.12.31 න් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

සටහන: **20**	**2022**	**2021**
මුදල් හා මුදල් සමාන දෑ	රු.	රු.
ලංකා බැංකුව, බත්තරමුල්ල ගි/අ. 0077769376 2021.12.31 දිනට ශේෂය	1,815,412.26	1,192,609.34
ලංකා බැංකුව තැප්‍රොබේන් ගි/අ. 008724393 2021.12.31 දිනට ශේෂය	5,399.66	5,399.66
අතැති මුදල්	-	-
එකතුව	**1,820,0811.92**	**1,198,009.00**

සටහන: 21	2022	2021
<u>උපචිත වියදම්</u>	රු.	රු.
ඉදිරියට ගෙනා ශේෂය 12/30	150.01	-
අතිකාල	-	59,396.08
ඉන්ධන වියදම්	105,400.00	22.903.00
විදුලිය	152,836.46	72,422.80
කාර්ය මණ්ඩල වැටුප්	280,367.22	254,121.25
දුරකථන/අන්තර්ජාල ගාස්තු	14,665.37	14,218.43
අනෙකුත් වියදම් (පුවත්පත් සැපයීම)	2,730.00	1,320.00
ආහාර වියදම් (පානීය ජලය සැපයුම)	18,900.00	3,000.00
දුම්කොළ වගාව වෙනුවට විකල්පභෝග හඳුන්වාදීමේ වැඩසටහන සඳහා වියදම	-	73,510.45
2021 වසර සඳහා විදුලි ගාස්තු (2021 දෙසැම්බර් විදුලි බිල අධි තක්සේරුව)	(150.01)	-
එකතුව	**574,899.05**	**500,892.01**

සටහන: 22	2022	2021
<u>ප්‍රතිපාදන</u>	රු.	රු.
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	946,400.00	687,157.50
විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන	3,708,000.00	4,368,000.00
එකතුව	**4,654,000.00**	**5,055,157.50**

සටහන: 23	2022	2021
<u>තැන්පතු</u>	රු.	රු.
පොදු තැන්පතු / ආදායම වෙනත්	39,875.00	-
එකතුව	39,875.00	-

සටහන: 24	2022	2021
<u>ප්‍රාග්ධනය හා සංචිත</u>	රු.	රු.
දු.ම.ජා.අ. අරමුදල	6,560,893.26	6,560,893.26
එකතුව	**6,560,893.26**	**6,560,893.26**

සටහන: 25	2022	2021
<u>රජයේ පුදානය- ප්‍රාග්ධන</u>	රු.	රු.
ඉ/ගෙ ශේෂය	19,206,567.21	17,321,578.4
ප්‍රාග්ධන ප්‍රතිපූරණය (25.1)	2,000,000.00	5,357,000.00
විදේශ ප්‍රදාන ප්‍රතිපූරණය (25.2)	7,063,075.20	7,147,165.00
ප්‍රාග්ධන ප්‍රදානය ක්‍රමක්ෂය (දේපළ හා උපකරණ, බුද්ධිමය දේපළ, අස්පෘශ්‍ය වත්කම් මත ක්ෂය)	(2,825,753.06)	(2,583,951.20)
වර්ෂය සඳහා ආදායම	(9,027,325.20)	(8,085,225.00)
එකතුව	**16,416,564.15**	**19,206,567.21**

දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය
2021.12.31 න් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

සටහන: 27	2022	2021
<u>පෙර වසරේ ගැලපීම</u>		රු.
ඉදිරියට ගෙනා ශේෂය	-	-
එකතුව	**-**	**-**

සටහන: 26	2022	2021
<u>ලැබිය යුතු දෑ</u>	රු.	රු.
ආපදා ණය	-	-
එකතුව	**-**	**-**

සටහන: 28	2022	2021
<u>පූර්ව ගෙවීම්</u>	රු.	රු.
වැඩසටහන් සඳහා අත්තිකාරම් (ප්‍රාග්ධන අත්තිකාරම්)	75,000.00	-
ඉන්ධන සැපයුම්කරු සඳහා තැන්පතුව	50,000.00	50,000.00
උ.ගෙ. බදු පූර්ව ගෙවීම	-	-
එකතුව	**125,000.00**	**50,000.00**

සටහන: **29**	**2022**	**2021**
සමුච්චිත අතිරික්ත/හිඟය (ආදායම් හා වියදම් ගිණුම)	රු.	රු.
ඉ/ගෙ ශේෂය	(9,961,479.56)	(6,663,301.51)
කාලසීමාව සඳහා අතිරික්තය/ හිඟය	1,043,683.60	(1,523,419.22)
විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන	-	576,000.00
ගෝලීය වැඩිහිටි දුම්කොළ සමීක්ෂණය සඳහා ප්‍රතිපාදන	-	(3,536,000.00)
සමුච්චිත ක්ෂයවීම - අස්පෘශ්‍ය වත්කම් (2016 සිට 2018 දක්වා සමුච්චිත ක්ෂයවීම)	-	(1,155,241.15)
2021 වසරේ ස්ථාවර වත්කම් ඉවත් කිරීම	(84,175.85)	-
එකතුව	**(9,001,971.81)**	**(9,961,479.56)**

සටහන: **30**	**2022**	**2021**
ප්‍රාග්ධන ප්‍රදානය ක්‍රමක්ෂය	රු.	රු.
රජයේ ප්‍රදානය - ප්‍රාග්ධන (2018 දේපළ හා උපකරණ, බුද්ධිමය දේපළ, අස්පෘශ්‍ය වත්කම් මත ක්ෂයවීම්)	2,825,753.06	2,583,951.20
එකතුව	2,825,753.06	**2,583,951.20**

සටහන**: 31**	**2022**	**2021**
ආදායම	රු.	රු.
ප්‍රාග්ධන ප්‍රතිපූරණය (25.1)	1,969,200.00	4,026,060.00
2019 වසර සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් ලත් මුදල්	7,058,125.00	4,059,165.00
වෙනත් ආදායම්	-	133,500.00
එකතුව	**9,027,325.20**	**8,218,725.00**

දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය
2021.12.31 න් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

සටහන**: 32**	**2022**	**2021**
වියදම්	රු.	රු.
වැඩසටහන් සඳහා වියදම් (භාණ්ඩාගාරයෙන් ලත් අරමුදල්)	2,177,865.21	3,378,148.83
වැඩසටහන් සඳහා වියදම් (ලෝ.සෞ.සං/බිලූම්බර්ග් වෙතින් ලත් අරමුදල්)	6,984,614.75	3,774,435.81
එකතුව	**9,162,479.96**	**7,152,584.64**

සටහන 33	**2022**	**2021**
ප්‍රාග්ධන ලාභ	රු.	රු.
ඉදිරියට ගෙනා ශේෂය	402,393.32	-
ප්‍රත්‍යාගණනය - පරිගණක හා පරිගණක උපකරණ	-	486,569.17
2021 වසරේ ස්ථාවර තැන්පතු ඉවත් කිරීම්	(84,175.85	(84,175.85
එකතුව	**402,393.32**	**402,393.32**

සටහන 34	**2022**	**2021**
ගෙවිය යුතු දෑ	රු.	රු.
ඉදිරියට ගෙනා ශේෂය	-	-
ගෙවිය යුතු මුද්දර ගාස්තු	(125.00)	-
එකතුව	**(125.00)**	**-**

සටහන 35:

වැරැද්ද සිදු වූ, ඉදිරිපත් කරන ලද පෙර කාල පරිච්ඡේද සඳහා, සන්සන්දනාත්මක සංඛ්‍යා නැවැත ප්‍රකාශ කිරීම මගින් හෙළිදරව් කිරීම් (ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර. 03)

- 2020 වසරේ විගණන ගාස්තු ප්‍රතිපාදනයෙහි රු. 576,000.00 ක අධිප්‍රතිපාදනය, 2021 වසරේ මූල්‍ය ප්‍රකාශනයේ ලාබයට ගලපා ඇත. එබැවින් 2021 මූල්‍ය වසරේ මෙහෙයුම් හිඟය එම ප්‍රමාණයෙන් වැඩියෙන් ප්‍රකාශ කර ඇත.

- 2021 වසරේ වත්කම් බැහැර කිරීම මත වූ රු.84,175.85 ක උත්පාදිත අලාබය, එම වසරේ මෙහෙයුම් හිඟයට ගිණුම්ගත කර නැත. මෙම අවස්ථාවෙහි සමාලෝචිත වර්ෂයේ හිඟය මූල්‍ය ප්‍රකාශනවල එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා ඇත. මෙය 2022 වසරේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරැදි කර ඇත.

- රු. 133,500.00 ක ආපසු නොගෙවන තැන්පතු සහ වත්කම් විකිණීමෙන් ලත් මුදල, 2021 වසරේ මූල්‍ය ප්‍රකාශනයේ සටහන 31 යටතේ ප්‍රාග්ධන ප්‍රතිපූරණය ලෙස හඳුනා ගෙන ඇත. 2022 වසරේ ලත් වෙනත් ආදායම් මූල්‍ය ප්‍රකාශනයේ සටහන් අංක 23 යටතේ නිවැරැදිව හඳුනා ගෙන ඇත.

- පෙර වසරවල මුද්‍රණය කරන ලද ස්ටිකර්, පත්‍රිකා සහ පෝස්ටර් තොගවල වටිනාකම, සංසන්දනාත්මකව මූල්‍ය ප්‍රකාශන කෙරෙහි බල පා නොමැති බව අධිකාරිය හඳුනා ගෙන ඇත.

දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය
2021.12.31 න් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්
සටහන: 36

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සම්බන්ධිත පාර්ශව සමග සිදුකළ ගනුදෙනු

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වන අනෙකුත් ආයතන	දරන තනතුර	පත්වීමේ දිනය	කාල පරිච්ඡේදය
වෛද්‍ය සමාධි රාජපක්ෂ මහතා, සභාපති, මද්‍යසාර හා දුම්කොළ පිළිබඳ ජාතික අධිකාරිය	-	-	-	-
පූජ්‍ය ඇල්ලේ ගුණවංශ හිමි ගරු සෞඛ්‍ය අමාත්‍යතුමිය විසින් පත්කරන ලදී				
වෛද්‍ය ලක්ෂ්මී සෝමතුංග මිය අතිරේක ලේකම්, (මහජන සෞඛ්‍ය සේවා) සෞඛ්‍ය අමාත්‍යාංශය	වික්ටෝරියා නිවාසය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි	2020 ජනවාරි	නිත්‍ය සාමාජික
	ආබාධිත සහිත තැනැත්තන් සඳහා ජාතික මණ්ඩලය	සාමාජික	2021 ඔක්තෝබර්	-
	මධ්‍යම පරිසර අධිකාරියේ පාරසරික සභාව	සාමාජික	2021 අප්‍රේල්	
සුමිත් අබේසිංහ මහතා ගරු සෞඛ්‍ය අමාත්‍යතුමිය විසින් පත්කරන ලදී	ශ්‍රී ලංකා මූල්‍ය කොමිසම	සභාපති	03.12.2020	වසර 03යි
	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	සාමාජික	2020 මාර්තු	වසර 03යි
සුධීර ජයරත්න මහතා අධ්‍යක්ෂ- කුඩා ව්‍යවසාය සංවර්ධන අංශය	ජාතික ශිල්ප සභාව	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි	05.01.2020	වසර 02 යි
එල්. කමල් සිල්වා මහතා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති	චින්දිතයන් ආරක්ෂා කිරීමේ අධිකාරිය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි	2022 අගෝස්තු	ඔහු තනතුර දරන තෙක්

එම්.ජේ. ගුණසිරි මහතා සුරාබදු කොමසාරිස් ජෙනරාල්	-	-		-
ආර්.පී. සත්කුමාර මහතා අතිරේක ලේකම්, තොරතුරු හා ජනමාධ්‍ය අමාත්‍යාංශය	ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව	අමාත්‍යාංශයේ නියෝජිත	12.07.2021	-
	සැලසිනේ රූපවාහිනී ආයතනය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි	23.02.2021	-
ශාක්‍ය නානායක්කාර මහතා සභාපති, අන්තරායකාර ඖෂධ පාලක ජාතික මණ්ඩලය	-	-	-	-
නිරණ්‍යා පෙරේරා මිය අධිකරණ අමාත්‍යාංශය ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්	ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව	කොමසාරිස්	18.02.2019	වසර 03යි
බී.එම්එස්. බණ්ඩාර මහතා අතිරේක ලේකම්, වෙළඳ අමාත්‍යාංශය	-	-	-	-
සුනිල් ශාන්ත වීරසේකර මහතා ගරු සෞඛ්‍ය අමාත්‍යතුමිය විසින් පත්කරන ලදී	පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, සබරගමුව පළාත	සාමාජික	30.12.2019	වසර 05යි
	සබරගමුව විශ්වවිද්‍යාලය	පරිපාලන මණ්ඩල සාමාජික	2022	වසර 03 යි
	සමාජ ආරක්ෂණ මණ්ඩලය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	2022	වසර 03 යි
ජී. කමණී ගුණරත්න මිය අධ්‍යක්ෂ, පාසල් සෞඛය හා පෝෂණ, අධ්‍යාපන අමාත්‍යාංශය	-	-	-	-
විජයන්ති රත්නායක මිය ගරු සෞඛ්‍ය අමාත්‍යතුමිය විසින් පත්කරන ලදී	-	-	-	-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } THO|B|NATA|1/22/04 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2023 මැයි 19 දින

සභාපති
දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය

දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව.විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 49 ඡේදය ප්‍රකාරව, වත්කම් පන්තියකට අයත් සියළු වත්කම් එකවර ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, ඊට පටහැනිව අධිකාරිය සතු පරිගණක හා පරිගණක උපකරණ අතරින් 2017 වර්ෂයට පෙර මිලදී ගෙන තිබුණු ශුද්ධ අගය රු.257,180 ක් වූ පරිගණක සහ පරිගණක උපකරණ පමණක් 2022 පෙබරවාරි 28 දින රු.743,750 කට ප්‍රත්‍යාගණනය කර පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු.486,570 ක ප්‍රත්‍යාගණන ලාභයක් හඳුනාගෙන තිබුණු අතර එම ප්‍රත්‍යාගණන අගය මත පදනම්ව පෙර වර්ෂය සහ සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂිකව රු.148,750 බැගින් ක්ෂය ගණනය කර ගිණුම්ගත කර තිබුණි. තවද වෘත්තීය සුදුසුකම් ඇති තක්සේරු වෘත්තියේ සාමාජිකයෙකු නොමැති කමිටුවක් විසින් ප්‍රත්‍යාගණනය කර තිබුණු බැවින් ප්‍රත්‍යාගණන අගයන්ගේ නිවැරදිතාවය පිළිබඳව මෙන්ම ප්‍රත්‍යාගණනය ක්‍රියාත්මක

වන දිනය හදුනාගෙන මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව්කර නොතිබුණු බැවින් ප්‍රත්‍යාගණන අගයන් පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ කර ගැනීමේ නිවැරදිතාවය පිළිබඳව සහ ප්‍රත්‍යාගණන අගය මත පදනම්ව පෙර වර්ෂයට සහ සමාලෝචිත වර්ෂයට අදාළව සිදුකර තිබුණු රු.297,500 ක ක්ෂය ගැලපීමේ නිවැරදිතාවය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 අධිකාරියේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අධිකාරියේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් කැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද ඉහත 1.2 (අ) නිර්දේශය හැර අනෙකුත් නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති, රෙගුලාසි හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද විධිවිධානවලට යොමුව	අනුකූල නොවීම්
(අ) 1978 අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය සහ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2009 සැප්තැම්බර් 01 දිනැති අංක DMA/2009 (2) දරන චක්‍රලේඛයේ 02 ඡේදය	2022 දෙසැම්බර් 31 දිනට රු.32,524,756 ක් වූ දේපල පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්වල පිරිවැය හා ප්‍රත්‍යාගණන අගයන් ඇතුළත් කළ හැකි වන පරිදි විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණු අතර ඒ වෙනුවට වත්කම් අයිතම ප්‍රමාණය දැක්වෙන පරිදි ප්‍රධාන ඉන්වෙන්ට්‍රි ලේඛනය පමණක් පවත්වා තිබුණි.
(ආ) 2015 සැප්තැම්බර් 25 දිනැති අංක SP /SB/07/15 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛය	විදේශාධාර/ණය මෙරටට පිරිනැමීම සිදුකරනු ලබන්නේ රටේ සංවර්ධනයට මිස අධික පිරිවැයක් සහිත වැඩසටහන් සඳහා යෙදවීමට නොවන බවත්, අත්‍යාවශ්‍ය ස්වකීය වැඩසටහන් අවම පිරිවැයක් යටතේ සංවිධානය කළ යුතු බවත් සහ රජය විසින් පහසුකම් සපයා ඇති ආයතන ඒ සඳහා යොදා යුතු බවත් චක්‍රලේඛයේ දක්වා තිබුණ ද ඊට පටහැනිව වැඩසටහන් 02 ක් සහ රැස්වීම් 02 ක් පිරිවැය අධික පෞද්ගලික හෝටල් වල පවත්වා තිබුණු අතර ඒ වෙනුවෙන් රු. 1,057,385 ක මුදලක් අධිකාරිය විසින් වැය කර තිබුණි.
(ඇ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 ඡේදය	මූල්‍ය වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන දින 22 ක් ප්‍රමාදවී විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.
(ඈ) 2021 අප්‍රේල් 09 දිනැති අංක සීජීඅයිආර්/2021/02-02 දරන දේශීය ආදායම් දෙපාර්තමේන්තු ලිපිය	රාජ්‍ය ආයතන හා රජයට අයත් ආයතන විසින් සැපයුම්කරුවන් වෙත ගෙවන ලද එකතුකල අගය මත බදු පිළිබඳ තොරතුරු නියමිත ආකෘති පත්‍ර ප්‍රකාරව සෑම කාර්තුවක්ම අවසන් වී ඊළඟ මාසයේ 15වන දිනට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතු වුවත් එපරිදි අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය පුරාවටම ක්‍රියාකර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) අධිකාරියේ වාර්තා අනුව වර්තමානයේ දුම්කොළ නිෂ්පාදන සඳහා ශ්‍රී ලංකාවේ පවතින බදුකරණ ව්‍යුහය අවිධිමත් සහ සංකීර්ණ බවත්, එය බදු වර්ග කිහිපයක එකතුවකින් සමන්විතවන බවත්, දුම්කොළ නිෂ්පාදන සඳහා පවතින බදුකරණය හරහා අයකරන බදුවල වාසියෙන් සියයට 51 ක් දුම්කොළ කර්මාන්තය සඳහා වන බවත්, 2016 වර්ෂයේ සිගරට් මත වූ සුරාබදු ආදායම රජයේ සමස්ථ ආදායමෙන් සියයට 7.3 ක් වුවත් එය 2020 වර්ෂය වන විට සියයට 3.1 දක්වා පහත වැටී තිබුණු බවත් නිරීක්ෂණය විය. ඒ අනුව අධිකාරිය විසින් 2020 සහ 2021 යන වර්ෂවලදී ලෝක සෞඛ්‍ය සංවිධානයේ මූල්‍ය ප්‍රදාන සහ දේශීය අරමුදල් ලෙස රු. 994,148 ක වියදමක් දරා දුම්කොළ සඳහා නව බදුකරණ සූත්‍රයක් හඳුන්වාදී තිබුණු අතර මෙම නව බදුකරණ සූත්‍රය යොදා ගැනීමෙන් 2021 වර්ෂයේ රු. බිලියන 91.6 ක්ව පවතින සිගරට් මත වූ සුරාබදු ආදායම 2026 වර්ෂය වන විට රු. බිලියන 124.6 ක් දක්වා වැඩිකර ගත හැකි බවටත්, එය දුම්කොළ පරිභෝජනය සියයට 1.1 කින් පහත වැටීමකට සහ වාර්ෂිකව රාජ්‍ය ආදායම සියයට 6 කින් පමණ වැඩිවීමකට හේතුවන බවටත් අපේක්ෂාකර තිබුණි. කෙසේ නමුත් දුම්කොළ සඳහා නව බදුකරණ සූත්‍රය මෙම වාර්තාවේ දිනය වන විටත් නීතියක් බවට පත්වී නොතිබුණි.

(ආ) 2006 අංක 27 දරන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතේ 35(2) (ඇ) වගන්තිය ප්‍රකාරව දුම්කොළ නිෂ්පාදන හෝ මධ්‍යසාර නිෂ්පාදන මහජනයාට අලෙවි කිරීම සඳහා තබා ඇති ස්ථානයක් තුළ දුම්කොළ නිෂ්පාදන හා මධ්‍යසාර නිෂ්පාදන ඒ ස්ථානයේ අලෙවි කිරීම සඳහා තිබෙන බව නියමකොට හඳුන්වා දෙමින් සහ ඒවායේ මිල ගණන් දක්වමින් නියමිත ප්‍රමාණයේ දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර ලබා දී තිබුණද, උක්ත වගන්තියට අදාළවන පරිදි නියෝග සකස් කර පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. ඒ අනුව පනත යටතේ වූ බලයලත් නිලධාරින්ට දුම්කොළ නිෂ්පාදන හෝ මධ්‍යසාර නිෂ්පාදන මහජනයාට අලෙවි කිරීම සඳහා තබා ඇති ස්ථානවල ප්‍රදර්ශනය කර තිබෙන දැන්වීම් නියාමනය කිරීමට නොහැකිවී තිබෙන බව නිරීක්ෂණය විය.

(ඇ) 2012 අගෝස්තු 08 දිනැති අංක 1770/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට්පත්‍රයේ 10 ඡේදය ප්‍රකාරව සහ 2015 අංක 3 දරන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත මඟින් සංශෝධිත 2006 අංක 27 දරන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතේ 34 අ(5) වගන්තිය ප්‍රකාරව සිගරට් සහ දුම්කොළ නිෂ්පාදකයින්ට සෞඛ්‍ය අවවාද මාස හයකට වරක් වෙනස් කර සිගරට් පැකට්, ඇසුරුම් හෝ කාඩ්බෝඩ් පෙට්ටි මත ප්‍රදර්ශනය කිරීමට හැකිවන පරිදි ඉහත ගැසට්පත්‍රය මඟින් ප්‍රකාශිත සෞඛ්‍ය අවවාද 08 ක සංචිතය පුළුල් කිරීම සඳහා 2022 වර්ෂයේදී සෞඛ්‍ය අවවාද 10 ක් හඳුනාගෙන තිබුණු නමුත් ඒවා වර්ග කිරීමක් (Categorize) කර නොතිබුණි. එසේම මෙම වාර්තාවේ දිනය දක්වාම එම නව සෞඛ්‍ය අවවාද රජයේ ගැසට්පත්‍ර මඟින් ප්‍රකාශයට පත් කර නොතිබුණි. 2015 වර්ෂයේ සිට මෙම වාර්තාවේ දිනය දක්වා වූ වසර 08 ක පමණ කාලපරිච්ඡේදය තුළ සෞඛ්‍ය අවවාද 08 ක සංචිතය පමණක් භාවිතා වීමෙන් සෞඛ්‍ය අවවාද වෙනස් කිරීමෙහි සඵලදායකත්වය උපරිම කර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) අධිකාරියේ සාමාන්‍යාධිකාරී තනතුර සඳහා 2021 වර්ෂයේ මැයි මස බඳවා ගෙන තිබුණු අයදුම්කරු (නිලධාරිනිය) විසින් අධිකාරියේ බඳවා ගැනීමේ පරිපාටියේ 4.1 ඡේදය යටතේ වූ අවශ්‍ය අවම සුදුසුකම් සපුරා නොතිබියදී සාමාන්‍යාධිකාරී තනතුරට පත්කර 2022 ජුනි දක්වා වැටුප් හා දීමනා වශයෙන් රු. 1,991,574 ක වියදමක් දරා තිබුණ ද සාමාන්‍යාධිකාරී තනතුරට අදාළ විෂය පථයේ රාජකාරී ඉටුකිරීමේදී ඉහත නිලධාරිනියගේ අකාර්යක්ෂමතාවය නිසා ඇයගේ සේවය 2022 ජූලි මස අවසන් කර තිබුණි. මෙලෙස අධිකාරියේ බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව අවශ්‍යවන අවම සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවකු සාමාන්‍යාධිකාරී තනතුරට පත්කර තිබීමෙන් එම තනතුර සඳහා අපේක්ෂා කළ පරිදි කාර්යසාධනයක් ලබා කර ගැනීමට අධිකාරිය අපොහොසත්වී තිබීම හේතුවෙන් දරන ලද රු. 1,991,574 ක වියදම අනාවර්තික ගණුදෙනුවක් බවට නිරීක්ෂණය විය.

(ආ) 2022 වර්ෂයේදී 1948 මනෝ උපදේශන සේවාව පවත්වාගෙන යාම සහ ප්‍රවර්ධනය වෙනුවෙන් අධිකාරිය විසින් රු.1,191,547 ක වියදමක් දරා තිබුණු අතර මනෝ උපදේශන සේවාව සැපයීම සඳහා කොන්ත්‍රාත් පදනම මත මනෝ උපදේශන සේවා නිලධාරිනියන් දෙදෙනකු වර්ෂය පුරා සේවය කර තිබුණි. එසේම අධිකාරිය විසින් 2021 හා 2022 යන වර්ෂයන්හිදී රු.1,307,282 ක වියදමක් දරා අවස්ථා තුනකදී සහතිකපත්‍ර මනෝ උපදේශන පාඨමාලා පවත්වා පුද්ගලයින් 108 දෙනෙකු සඳහා සහතික පත්‍ර නිකුත්කර තිබුණු අතර ඉන් නිලධාරීන් 83 ක් ස්වේච්ඡා පදනම මත වැටුප් හෝ දීමනා ගෙවීමකින් තොරව කාර්යාල වේලාවෙන් පසුව ඉහත මනෝ උපදේශන සේවාවේ යෙදීමට අවස්ථාව ලබා දී තිබුණි. ඒ අනුව 2022 වර්ෂය තුළ උපදේශනය කර තිබුණු මුළු ඇමතුම් සංඛ්‍යාව 3,666 ක් වූ අතර ඉන් ඇමතුම් 2085ක් ස්වේච්ඡා මනෝ උපදේශන සේවා නිලධාරීන් විසින් උපදේශනය කර තිබුණි. කෙසේ නමුත් දින 143 කදී සිදුකරන ලද මනෝ උපදේශන සංඛ්‍යාව පිළිබඳව එම ස්වේච්ඡා නිලධාරීන් විසින් අධිකාරියට වාර්තා කර නොතිබුණි. එසේම ස්වේච්ඡා නිලධාරීන් විසින් උපදේශනය කරන ලද ඇමතුම් සංඛ්‍යාව පමණක් වාර්තාකරන අතර ඔවුන් විසින් සපයා තිබුණු උපදේශන සේවාවේ ගුණාත්මකභාවය පිළිබඳව ඇගයීමක් අධිකාරිය විසින් සිදුකර තිබුණු බවට ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. ඒ අනුව ස්වේච්ඡා මනෝ උපදේශන සේවා නිලධාරීන් විසින් සිදුකර තිබුණු උපදේශනය සම්බන්ධයෙන් වූ අධිකාරියේ අධීක්ෂණය දුර්වල මට්ටමක පැවතුණි.

(ඇ) 2019 අප්‍රේල් 22 දිනැති අංක 09/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව 2019 ජූලි මාසයේ සිට 2021 දෙසැම්බර් මාසය දක්වා අධිකාරියේ නිලධාරීන් 13 දෙනෙකු වෙත ගෙවා තිබුණු රු.690,648 ක අන්තර් දීමනාව සහ 2021 ජුනි 15 දිනැති අංක 21/Misc (032) දරන අමාත්‍ය මණ්ඩල තීරණයට සහ සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 2021 ජුනි 16 දිනැති අංක MIN/add/See/Admin/16/21 දරන ලිපියට පටහැනිව 2021 ජුනි මාසයේ සිට 2021 අගෝස්තු මාසය දක්වා අධිකාරියේ කාර්ය මණ්ඩලයේ 12 දෙනෙකු වෙත ගෙවන ලද රු.262,375 ක විශේෂ දීමනාව මෙම වාර්තාවේ දිනය වන විටත් අදාළ නිලධාරීන්ගෙන් හෝ ඊට වගකිවයුතු පාර්ශවයන්ගෙන් ආපසු අයකර නොතිබුණි.

(ඈ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 4.4 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අධිකාරිය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති